# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,860 – 2014 අප්‍රේල් මස 25 වැනි සිකුරාදා – 2014.04.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

### තනතුරු - ඇබෑර්තු

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු —
මොණරාගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 මැයි මස 26 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 අප්‍රේල් මස 02 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3 හි රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මොණරාගල | කතරගම | මොණරාගල දිස්ත්‍රික්කයේ කතරගම කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල |

04-599

---

**අධිකරණ අමාත්‍යාංශය**

වීඩියෝ කැමරා ශිල්පී තනතුර සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීම

අධිකරණ අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින වීඩියෝ කැමරා ශිල්පී තනතුර සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීමට පහත සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අධ්‍යාපන සුදුසුකම්* : අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ගණිතය සහ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ඇතුළුව අවම වශයෙන් විෂයයන් 04කට සම්මාන සහිතව එක් වරක දී විෂයයන් 06කින් සමත්වී තිබීම.

02. *වෘත්තීය සුදුසුකම්* :ඡායාරූපකරණය පිළිබඳව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 5ට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.

03. *පළපුරුද්ද* : තනතුරට අදාළ රාජකාරි සම්බන්ධයෙන් ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

04. *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

05. *වයස් සීමාව* : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

06. *වෙනත්* :
I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය. අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා අ. පො. ස. (සා/පෙළ) සහතිකයේ පිටපත් ද, වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ සහතිකයේ පිටපතක් ද, පළපුරුද්ද සනාථ කිරීමේ සහතිකයේ පිටපතක් ද, වයස සනාථ කිරීම සඳහා උප්පැන්න සහතිකයේ පිටපතක් ද, ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් ද, අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුයි. අදාළ සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් නොකරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

07. *වැටුප් පරිමාණය* : මාසික දීමනාව රු. 14,425.

08. *තාවකාලික පදනම මත සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගින්

09. *රාජකාරි ස්වභාවය* :-
1. වීඩියෝ කිරීම, විශේෂ වැදගත්කමකින් යුතු අවස්ථා රූපගත කිරීම හා සංස්කරණය.
2. සංස්කරණ උපකරණ හා සංස්කරණ මැදිරිය භාරව කටයුතු කිරීම හා එහි නඩත්තු කටයුතු.
3. වීඩියෝ පට ලේඛනාගාරය භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු.
4. වීඩියෝ පට ලේඛනයක් පවත්වාගෙන යාම හා සුචිගත කිරීම.
5. වීඩියෝ කැමරා අංශයේ ඉන්වෙන්ට්‍රිය හා ගබඩාව භාරව කටයුතු කිරීම.
6. ඇස්තමේන්තු සකස් කිරීම.
7. ඕනෑම වර්ගයකට අයත් කැමරාවක් පරිහරණය කිරීම, ගෙමිට් ඡායාරූප ගැනීම, ඩිජිටල් ක්‍රමය අනුව රූප රාමු ලබා ගැනීම හා සකස් කිරීම.
8. පරිගණක ආශ්‍රිත සංස්කරණය හා ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්.

10. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :
මෙම තනතුර තාවකාලික තනතුරක්වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි.

11. මෙම නිවේදනයේ පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කරගත් අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කර, 2014 මැයි මස 09 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරෙහි " අධිකරණ අමාත්‍යාංශයේ වීඩියෝ කැමරා ශිල්පී තනතුර" යනුවෙන් සඳහන් කළ යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු ය.

ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය,
උපරිමාධිකරණ සංකීර්ණය,
කොළඹ 12.

11. *ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමේ ක්‍රමය* :

| | *පරීක්ෂාකර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. | වීඩියෝ කැමරා හා ඊට අදාළ උපකරණ ක්‍රියාකරවීම | 30 | 40% |
| 2. | වෘත්තීය ආවරණයට සුදුසු පරිදි දර්ශන තෝරාගැනීම හා දත්ත එක්රැස් කිරීම | 20 | |
| 3. | රූපවාහිනී දර්ශනවලට අදාළව ස්වාභාවික ආලෝකය උපයෝගීකර ගැනීම හා රූපගත කිරීම සඳහා විදුලි අලෝකය යෙදීම | 20 | |
| 4. | පරිගණක තාක්ෂණය භාවිතයෙන් ප්‍රවෘත්ති සංස්කරණය පිළිබඳ හැකියාව | 10 | |
| 5. | කැසට් පට පටිගත කිරීමේ තාක්ෂණය හා ඊට අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම | 10 | |
| 6. | රූපවාහිනී මැදිරි තුළ රූගත කිරීම පිළිබඳ සාමාන්‍ය දැනුම | 10 | |
| | **එකතුව** | **100** | |

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමේ ක්‍රමය* :

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය 100%* | *තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාල නොවේ |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 25 | |
| වෘත්තීය පළපුරුද්ද | 30 | |
| තොරතුරු තාක්ෂණය/ පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් | 10 | |
| භාෂා ප්‍රවීණතාවය | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |

සටහන : ප්‍රායෝගික පරීක්ෂණය සමත් අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය යන දෙකෙන්ම ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

12. ඉල්ලුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, ඉල්ලුම්පත්‍රය හෝ ඒ හා සම්බන්ධ ලිපි තැපෑලේ දී නැතිවූ බවට කරන පැමිණිලි සළකා බලනු නොලැබේ.

13. යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබීම හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සෙකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමටත් ඉඩ ඇත.

මෙහි සඳහන් නොවන කරුණක් සඳහා තීරණ ගැනීමේ බලධාරියා අධිකරණ අමාත්‍යාංශ ලේකම් වේ.

කමලිනී ද සිල්වා,
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

2014 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***අධිකරණ අමාත්‍යාංශයේ වීඩියෝ කැමරා ශිල්පී තනතුර සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීම***

අංකය :—————.
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. සම්පූර්ණ නම : සිංහලෙන්/දෙමළෙන් :—————.
ඉංග්‍රීසියෙන් :—————.
02. මුලකුරු සමග නම : සිංහලෙන්/දෙමළෙන් :—————.
ඉංග්‍රීසියෙන් :—————.
03. පුද්ගලික ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් :—————.
ඉංග්‍රීසියෙන් :—————.
04. උපන් දිනය :—————.
05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු :—————.
මාස :—————. දින :—————.
06. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
07. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
08. විවාහක/අවිවාහක බව :—————.
09. දුරකථන අංකය :—————.
10. අධ්‍යාපන සුදුසුකම් :—————.

අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය
වර්ෂය :—————. විභාග අංකය :—————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

අ. පො. ස. (උසස් පෙළ) විභාගය
වර්ෂය :—————. විභාග අංකය:—————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

11. වෘත්තීය සුදුසුකම් :—————.
(අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් පරිදි)

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 මැයි මස 16 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 මැයි මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

12. පළපුරුද්ද :————.
(අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් පරිදි)
13. වෙනත් සුදුසුකම් :————.
14. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සඳහන් කරනු ලබන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් වන බවත්, තෝරා පත්කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................. යන අය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ................. තනතුරේ ස්ථිර/අනියම්/තාවකාලික, නිලධාරියෙකු/නිලධාරිණියක වශයෙන් සේවය කරන බවත්, පෞද්ගලික ලිපිගොනුව අනුව ඔහු/ඇය විසින් ඉහතින් සඳහන් කර ඇති සියලු තොරතුරු නිවැරදි බවත්, මෙම නිලධාරියාට විරුද්ධව විනය ක්‍රියාමාර්ගයක් ගෙන ඇති/නැති බවත්, ඔහු/ඇය ඉහත කී තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් මුදාහැරිය හැකිය/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.
04-618

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 මැයි මස 26 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 අප්‍රේල් මස 03 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | හාරිස්පත්තුව | මැදසියපත්තුව අංක 02 කොට්ඨාසයේ උප්පැන්න මරණ හා හාරිස්පත්තුව විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |

04-745

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ක්‍රීඩා අමාත්‍යාංශය

**නීති නිලධාරි (විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම**

ක්‍රීඩා අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*
නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම් :*
(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම/ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.
(ii) පළපුරුද්ද :
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් තිබීම.
(iii) කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
(iv) වෙනත්
* ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
* අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
* අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*
(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
(ii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් ය. නීති නිලධාරි III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත් බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.
(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුනු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.
(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

04. *වයස් සීමාව :*
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුයි.

05. *වැටුප් පරිමාණය :*
මෙම තනතුරට රු. 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1050 -53555 මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2006.04.25 දිනැති රා. ප.ච. අංක 6/2006 හි අංක SL- 1-2006 වැටුප් බණ්ඩය)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** | | 20 |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය සඳහා | | |
| | - පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 20 | |
| | - දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 15 | |
| | - දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| | - නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| | - නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | | 10 |
| | **සටහන** : ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 10 ලබා දිය යුතු ය. (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්) | | |
| 02 | *අතිරේක වෘත්තීය සුදුසුකම් :* | | 15 |
| | පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්) | | |
| | පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්) | | |
| | පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්) | | |
| 03 | *අතිරේක පළපුරුද්ද :* | 30 | |
| | නීතිඥවරයකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02 එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30 ක් (මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර) (අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයකුගේ හෝ ජනාධිපති නීතිඥවරයකුගේ හෝ විනිසුරුවරයකුගෙන් ලබා ගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතු ය. | | |
| 04 | *තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :* | | 15 |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා | 15 | |
| | රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු හෝ පැය 1500කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 10 | |
| | රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| | - මාස 06/පැය 720 | 07 | |
| | - මාස 03/පැය 360 | 05 | |
| 05 | *ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :* | | 15 |
| | ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/ නීතිවේදී උපාධිය (අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය.) | 15 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01ක් හෝ පැය 1500) | 10 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාක් සඳහා | | |
| | - මාස 06/පැය 720 | 07 | |
| | - මාස 03/පැය 360 | 05 | |
| 06 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | | 05 |
| | මුළු එකතුව | | 100 |

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.
සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.
i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08.
(අ) අයදුම්පත් 2014.05.19 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
ලේකම්,
ක්‍රීඩා අමාත්‍යාංශය,
අංක 09,
පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07
(ආ) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම භාවිතා කරමින් සැකසිය යුතු ය.
(ඇ) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු ය.
i. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු/සාමදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 22,935 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.
ii. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාතේ රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.
iii. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම :*
ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,
ඒ. එම්. ජයවික්‍රම,
ලේකම්,
ක්‍රීඩා අමාත්‍යාංශය.

***ක්‍රීඩා අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත***

01. (i) මුලකුරු සමග නම :————. මයා/මිය/මෙනවිය (සිංහලෙන්)
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(සිංහලෙන්) මයා/මිය/මෙනවිය
(iii) මුලකුරු සමග නම : Mr./Mrs./Miss.————.
(ඉංග්‍රීසියෙන්)
(iv) මුලකරුවලින් හැඳින්වෙන නම් : Mr./Mrs./Miss ———.
(ඉංග්‍රීසියෙන්)
02. පෞද්ගලික ලිපිනය :————.
03. දුරකථන අංකය :————.
04. දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවකු නම් කාර්යාලයීය ලිපිනය :—————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
06. ජාතික හැඳුනුම්පත් අංකය :————.
07. උපන් දිනය :————.
08. 2014.05.19 දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.
09. විවාහක/අවිවාහක බව :————.
10. ඔබ උසාවිය ඉදිරියේ කිසියම් චෝදනාවකට වරදකරු වී ඇත් ද? :————. ඔව්/නැත
පිළිතුර "ඔව්" නම් විස්තර සපයන්න.
11. *අයදුම්කරුගේ ප්‍රකාශය :*
ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. එම කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළිවුවහොත් නුසුදුස්සකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි කිසිවක් අනාවරණය වුවහොත් මා සේවයෙන් ඉවත් කිරීමට යටත් වන බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12. අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුතු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

මෙම අයදුම්කරු වන ...................... මහතා/මිය/මෙනවිය විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය ............ දින සිට ............ තනතුරේ මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන බවට සහතික කරනු ලබන අතර, ඔහු/ඇය කිසිදු විනය නියෝගයකට යටත් කර නොමැති බවත්, එසේ කිරීමට අදහස් කර නොමැති බවත්, මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් මුදා හැරිය හැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
04-734

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2014
කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2017

2015/2017 කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිංහල හා දෙමළ මාධ්‍ය වලින් 2014.08.09 වැනි දින ප්‍රධාන නගර කිහිපයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයන්හි පවත්වනු ලැබේ.

02. කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව

2.1 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවල මෙතෙක් පවත්වාගෙන යනු ලැබූ කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව කෘෂිකර්ම නිෂ්පාදන තක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව ලෙස නම් කර ඇති අතර, මෙම පාඨමාලාව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇත. මෙම පාඨමාලාව සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 6 මට්ටම ලබා දීමට නියමිතය.

2.2 කෘෂිකර්ම නිෂ්පාදන තක්ෂණය පිළිබඳ මෙම පාඨමාලාව ගැහැණු පිරිමි දෙපක්ෂයටම විවෘත වන අතර, මෙම විභාගයෙන් සුදුසුකම් ලැබූ අය සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව කුසලතා හා දිස්ත්‍රික් පදනම මත අඟුණකොළපැලැස්ස, කරපිංච, කුණ්ඩසාලේ, පැල්වෙහෙර සහ වව්නියාව යන කෘෂිකර්ම විද්‍යාල පහට තෝරා ගනු ලැබේ.

2.3 සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙනුයේ සුදුසුකම් ලැබූ අයගේ ප්‍රතිඵල සනාථ කිරීම සඳහා පමණි.

2.4 මෙම පාඨමාලාව පළමු වසරේ දී සිංහල හා දෙමළ මාධ්‍යයෙන් ද දෙවන වසරේ දී ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද පවත්වනු ලබයි. ඒ අනුව අඟුණකොළපැලැස්ස, කරපිංච, පැල්වෙහෙර යන කෘෂිකර්ම විද්‍යාලයන්හි

පළමු වසර සිංහල මධ්‍යයෙන් ද වව්නියාව කෘෂිකර්ම විද්‍යාලයෙහි පළමු වසර දෙමළ මාධ්‍යයෙන්ද, කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයෙහි පළමු වසර සිංහල හා දෙමළ යන මාධ්‍ය දෙකෙන්ද පැවැත්වේ. සියලුම විද්‍යාලවල දෙවන වසර ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

2.5 මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමට කෘෂිකර්ම විද්‍යාලයෙන් අවුරුදු දෙකක පුහුණුවෙන පසු මාස 06ක නම් කරන ලද ආයතනයක රැකියාස්ථ පුහුණුවක් ලබා ගැනීම අනිවාර්ය වේ.

2.6 කෘෂිකර්ම විද්‍යාලයේ පාඨමාලා පැවැත්වෙන කාලය තුළ නේවාසිකව සිටීම අනිවාර්යය වේ.

03. *පාඨමාලා සඳහා ඇතුළත්වීමට තිබිය යුතු සුදුසුකම් :*

3.1 (අ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන හෝ විශිෂ්ට සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය හෝ කෘෂි ආහාර තාක්‍ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයයන් 06න් එකකටවත් සම්මාන සාමාර්ථයක්ද ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන සාමාර්ථ හතරක් (04) තිබිය යුතුය.) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සහිතව අ. පො. ස. (සා. පෙ.) සමත් වී තිබිය යුතුය. මෙහිදී එක් වරකදී විෂයයන් තුනකට සම්මාන සාමාර්ථ සහිතව අවම වශයෙන් විෂයයන් 05ක් සමත්වී තිබිය යුතුය;

*සහ*

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂය ධාරාව හදාරා උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයයන් හයෙන් තුනක් එක්වර සමත්වී තිබිය යුතුය. (පාඨමාලාවට තෝරා ගැනීමේදී මෙම සුදුසුකම ඇති සිසුන්ට දිස්ත්‍රික් මට්ටමේදී ප්‍රමුඛතාවක් ලබාදෙනු ලැබේ.);

*හෝ*

(ආ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන හෝ විශිෂ්ට සාමාර්ථද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය හෝ කෘෂි ආහාර තාක්‍ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයයන් 06න් අවම වශයෙන් එකකටවත් සම්මාන සාමාර්ථයක්ද ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන සාමාර්ථ හතරක් (04) තිබිය යුතුය.) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සහිතව අ. පො. ස. (සා. පෙ) සමත්වී තිබිය යුතුය. මෙහිදී එක් වරකදී විෂයයන් තුනකට සම්මාන සාමාර්ථ සහිතව අවම වශයෙන් විෂයයන් 05ක් සමත් වී තිබිය යුතුය;

*සහ*

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී ජීවවිද්‍යා විෂය ධාරාව හදාරා උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයයන් හයෙන් එකක් හෝ දෙකක් හෝ සමත්වී තිබිය යුතුය. (උසස් පෙළ සඳහා ගණිතය විෂය ධාරාව හැදෑරූ සිසුන් රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව සමත් වී තිබීම මෙම පාඨමාලාවට සුදුසුකම් ලැබුවා සේ නොසැලකේ.) මෙම සුදුසුකම් ඇති අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ යම් දිස්ත්‍රික්කයකින් කෘෂිකර්ම විද්‍යාලවලට බඳවා ගනු ලබන සංඛ්‍යාව සඳහා 3.1 (අ) හි අයදුම්කරුවන් සියලුම දෙනා තෝරා ගැනීමෙන් පසු තවදුරටත් අදාල දිස්ත්‍රික්කයෙහි පුරප්පාඩු ඇතොත් පමණි;

3.2 2014.05.28 වැනි දිනට අපේක්‍ෂකයාගේ වයස අවුරුදු 17ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 25ට වැඩි නොවිය යුතු ය. රජයේ සේවයේ නියුතු අය මෙම තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

04. *පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම :*

4.1 මෙම දැන්වීම අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාර අයදුම්කරුවන්ගේ අත් අකුරුවලින් හෝ යතුරු ලියනයකර හෝ පරිගණක ගත කරගෙන 8"x 12" ප්‍රමාණයේ (A 4 ප්‍රමාණයේ) කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් තම අයදුම්පත සකස් කළ යුතු ය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුවේ. එහි අංක 01 සිට අංක 10 තෙක් මුල් පිටුවේ ද, 11 සිට 14 තෙක් දෙවන පිටුවේ ද, ඉතිරිය 3 වැනි පිටුවේ ද සඳහන් කළ යුතු වේ. අසම්පූර්ණව පුරවා ඇති හා ආදර්ශ ආකෘතිය අනුව සකස් නොකළ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තමන් සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු/කාරිය විසින් වගබලාගත යුතු වේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් තමන් ළඟ තබාගත යුතු වේ.

4.2 විභාග ගාස්තුව රු. 400කි. අපේක්‍ෂකයා විසින් තැපැල් කාර්යාලයකින් ලබාගත් රු. 400ක වටිනාකමින් යුත් මුදල් ඇණවුමක් කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල් නමින් ලබාගෙන මාරු කර ගන්නා තැපැල් කාර්යාලය "පේරාදෙණිය" වශයෙන් සඳහන් කර අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ ඇලවීමට කටයුතු කළයුතු වේ. (ගලවා ගැනීමට හැකි වනසේ) තව ද මුදල් ඇණවුමේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීමට කටයුතු කළ යුතුය. මොනම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගයට ගෙවන ලද ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කළ නොහැක. විභාග ගාස්තු සඳහා වූ මුදල් ඇණවුම අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.

4.3 සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2014 මැයි මස 28 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "අධ්‍යක්‍ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය" කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාද වන හෝ නැතිවන හෝ අයදුම්පත් ගැන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

4.4 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "2015/2017 කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් වීම" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

05. *විභාග මධ්‍යස්ථාන :*

2015/2017 කෘෂිකර්ම නිෂ්පාදන තාක්‍ෂණය පිළිබඳව ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය, විභාග දෙපාර්තමේන්තුව මගින් සිංහල හා දෙමළ මාධ්‍ය වලින් 2014 අගෝස්තු මස 09 වැනි දින පහත සඳහන් නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පවත්වනු ලැබේ.

| *නගර අංකය* | *නගරය* | *නගර අංකය* | *නගරය* |
|---|---|---|---|
| (1) | අනුරාධපුරය | (8) | කුරුණෑගල |
| (2) | බදුල්ල | (9) | මාතර |
| (3) | මඩකලපුව | (10) | ත්‍රිකුණාමලය |
| (4) | කොළඹ | (11) | වවුනියාව |
| (5) | ගාල්ල | (12) | රත්නපුරය |
| (6) | යාපනය | (13) | හම්බන්තොට |
| (7) | මහනුවර | (14) | කිලිනොච්චිය |

කිසියම් විභාග මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් විභාග අපේක්‍ෂකයන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති විට ඔවුන්ගේ දෙවැනි කැමැත්ත අනුව හෝ අයදුම්කොට ඇති මධ්‍යස්ථානයට සමීප වෙනත් විභාග මධ්‍යස්ථානයක් හෝ ඔවුන්ට නියම කෙරෙනු ඇත. විභාගය සඳහා ඉල්ලුම් කළ නගරය/නගර හෝ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

06. *විභාග ක්‍රමය :*

6.1 තරග විභාගය සඳහා වූ විෂයයන් හා කාල සටහන පහත සඳහන් වේ. :-

| | *විෂයයන්* | *කාලය* | *කාල සටහන* |
|---|---|---|---|
| 01. | පළමු ප්‍රශ්න පත්‍රය (01) - කෘෂිකර්මය (ලකුණු 100 යි) (අ. පො. ස. (සා. පෙළ) කෘෂිකර්ම විෂය නිර්දේශ මට්ටම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පොදු විෂය කරුණු ආශ්‍රිතව සකස් කළ බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න අඩංගු වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.) | පැය 1 යි | 09.30 පැය - 10.30 පැය |
| 02. | දෙවන ප්‍රශ්න පත්‍රය (02) - බුද්ධි පරීක්‍ෂණය (ලකුණු 100යි) (රටා, සබදතා, පුරෝකථන, ගැලපීම්, විශ්ලේෂණ කුසලතා පිළිබඳ හැකියා ආදිය පරීක්‍ෂාවට ලක්වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ) | පැය 1 යි | 11.00 පැය - 12.00 පැය |

6.2 මෙහි 3.1 සහ 3.2 ඡේදයන්හි සඳහන් සුදුසුකම් ඇති සියලුම අයදුම්කරුවන්ට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාවේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කර පහත අ, ආ සහ ඇ හි සඳහන් ලියවිලිවල සහතික කරන ලද, ඡායා පිටපත් ද සමගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඔබගේ ප්‍රවේශ පත්‍රය නොලැබීම පිළිබඳ දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(අ) අයදුම්පත්‍රයේ ඡායා පිටපතක්;

(ආ) විභාගය සඳහා මුදල් ගෙවූ මුදල් ඇණවුමේ ඡායා පිටපතක්;

(ඇ) අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියේ ඡායා පිටපතක්.

6.3 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිසුන් ලබා ගත් ලකුණු ඔවුන්ගේ ලිපිනයන්ට දන්වා එවනු ඇත. දිස්ත්‍රික් මට්ටමෙන් ඉහත විෂයයන් දෙකේ එකතුවෙහි වැඩිම ලකුණු ලබාගත් සිසුන් පමණක් සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ඇත. මෙම ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩ දීම මත හෝ සම්මුඛ පරීක්‍ෂණයට පෙනී සිටීමට කැඳවීම මත හෝ අදාළ අපේක්‍ෂකයාගේ සුදුසුකම් පිළිගැනීමක් නොවන බව සැළකිය යුතුය. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන්පසුව හෝ යන කවර අවස්ථාවකදී වුවත් මෙම නිවේදනයේ කරුණු අනුව නුසුදුසු යයි තීරණය වන අයදුම්කරුවකුගේ විභාගාපේක්‍ෂකත්වය අවලංගු කරනු ලැබේ.

6.4 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්‍ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අපේක්‍ෂකයින්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

07. *බඳවා ගැනීමේ ක්‍රමවේදය :*

7.1 බඳවා ගන්නා වර්ෂය තුළ දී එක් එක් මාධ්‍යයෙන් සියලුම කෘෂිකර්ම විද්‍යාලවලට බඳවා ගන්නා මුළු සංඛ්‍යාව පදනම් කරගෙන අයදුම්කරුවන් සිටින දිස්ත්‍රික්කවලට එක් එක් මාධ්‍යයෙන් ඇතුළත් කරගනු ලබන සංඛ්‍යාව තීරණය කරගනු ලැබේ. ඉන්පසුව එක් එක් මාධ්‍යය සඳහා දිස්ත්‍රික්කයට අයත් අයදුම්කරුවන් අතරින් තරග විභාගයේ පළමු හා දෙවන විෂයයන් දෙකේ ලකුණු එකතුව අනුව වැඩිම කුසලතාව පෙන්නුම් කළ අයදුම්කරුවන් හෝ අයදුම්කාරියන් තෝරාගනු ලැබේ. එසේ තේරීමේ දී පහත සඳහන් කරුණු ද සැලකිල්ලට ගනු ලැබේ.

7.2 දිස්ත්‍රික් පදනම සළකා බැලීමේදී අ. පො. ස. (සා. පෙළ) විභාගයට පළමුවන වරට පෙනී සිටි දිස්ත්‍රික්කය අයදුම්කරු හෝ අයදුම්කාරිය අයත් දිස්ත්‍රික්කය ලෙස සලකනු ලැබේ. අ. පො. ස. (සා. පෙළ) විභාගයට පළමුවන වරට පෙනී සිටි දිස්ත්‍රික්කයට අදාළ අංකය සොයා අයදුම්පතේ අංක 5 පිරවීම සඳහා මෙම *ගැසට් නිවේදනයේ* අවසානයට පළකර ඇති ඇමුණුම් අංක 01 උපයෝගී කරගත යුතුවේ.

7.3 ලිඛිත විභාගයේ කෘෂිකර්මය හා බුද්ධි පරීක්‍ෂණය යන විෂයයන් දෙකේ ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගන්නා අපේක්‍ෂකයින් දිස්ත්‍රික් පදනමින් තෝරාගෙන සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලැබේ. ප්‍රතිඵල ලේඛනයේ දිස්ත්‍රික් කුසලතාවය ගණනය කිරීම සඳහා අයදුම්පත්‍රයේ අංක 5 යටතේ වූ තොරතුරු පදනම් කරගනු ලැබේ. එහිදී අ. පො. ස. (උ. පෙළ) ජීව විද්‍යා විෂයය ධාරාව හාදාරා විෂයයන් 03කින් එකවර සමත් වූ හා තරග විභාගයේ විෂයයන් දෙකේ එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගෙන කුසලතාවය දැක්වූ අයට ප්‍රමුඛතාවය දෙමින් ඒ අය පළමුව තෝරා ගනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් යම් මාධ්‍යයක් සඳහා එවැනි අයදුම්කරුවන් නොමැති විට හෝ එවැනි අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විට දී පමණක් එම දිස්ත්‍රික්කයෙන් එම මාධ්‍යය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව සම්පූර්ණ වනසේ අ.පො.ස. (උ.පෙළ) විෂයයන් දෙකක් හෝ එකක් සමත් අයදුම්කරුවන් අතරින් තරග විභාගයේ විෂයයන් දෙක සඳහා වැඩිම ලකුණු ලබාගෙන කුසලතාවය දැක්වූ අයදුම්කරුවන් තෝරාගනු ලැබේ. මෙම තෝරා ගැනීම අනිවාර්යයෙන්ම 7.1 හා 7.2 හි සඳහන් ආකාරයට දිස්ත්‍රික්ක පදනමින් හා විභාගයේ දී දැක් වූ කුසලතාවන් අනුව කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල් අනුමත කර ඇති ක්‍රමයක් අනුව සිදු කෙරේ. අදාළ වර්ෂයේ දී එක් එක් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් කරගනු ලබන පිරිමි හා ගැහැණු සිසුන් සංඛ්‍යාව එම විද්‍යාලවල පිරිමි හා කාන්තා නේවාසිකාගාරවල ඇති ඉඩකඩ අනුව හා එම විද්‍යාලවල ඇති පුහුණු පහසුකම් අනුව තීරණය කරනු ඇත. මේ නිසා තෝරා ගැනීමට සලකා බලන තරග විභාගයේ විෂයයන් දෙකේ ලකුණුවල එකතුවේ කඩඉම් ලකුණු මට්ටම් දිස්ත්‍රික්කයක පිරිමි හා ගැහැණු අයදුම්කරුවන් අතර හා පාඨමාලාව හදාරන එක් එක් මාධ්‍යය අනුව වෙනස් වේ. කිසියම් දිස්ත්‍රික්කයක තෝරා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති විට දී විද්‍යාලවලට එක් එක් මාධ්‍යයට උපරිම සිසුන් ප්‍රමාණයක් ඇතුළත් කිරීම සඳහා අනිකුත් දිස්ත්‍රික්කවලින් අවශ්‍ය සිසුන් සංඛ්‍යාව තෝරාගනු ලැබේ.

7.4 ඉහත සඳහන් කරුණු සලකා බලමින් තරග විභාගයේ විෂයයන් දෙකේ ලකුණු එකතුව අනුව වැඩිම ලකුණු සංඛ්‍යාවක් ලබාගත් සිසුන් සීමිත ප්‍රමාණයක්, එක් එක් දිස්ත්‍රික්කයකින් කැඳවා ඔවුන්ගේ අධ්‍යාපනික සහතික හා වෙනත් සහතික හෝ පරීක්‍ෂා කිරීමට සම්මුඛ පරීක්‍ෂණයක් පවත්වනු ලැබේ. අයදුම්පතේ සඳහන් සහතිකවල මුල් පිටපත් මෙහි දී පරීක්‍ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්‍ෂණයට ලකුණු ලබාදෙනු නොලැබේ. කෘෂිකර්ම විද්‍යාලවලට තෝරාගනු ලබන සිසුන් සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලැබේ.

08. *"කුසුම් ලක්‍ෂමී කරුණාතිලක" සිහිවටන ශිෂ්‍යත්වය :*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ දී කෘෂිකර්මය, බුද්ධි පරීක්‍ෂණය යන ප්‍රශ්න පත්‍ර දෙකේ එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගත් ඕනෑම මාධ්‍යයක අයදුම්කාරියකට ඉහත ශිෂ්‍යත්වයේ කොන්දේසිවලට යටත්ව වර්ෂ දෙකක් සඳහා මෙම ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබේ. තෝරාගත් ශිෂ්‍යත්වලාභිණියට කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ඉගෙනුම ලැබීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. මෙම ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම රු. 10,000 ක් වේ.

ආචාර්ය ආර්. ආර්. ඒ. විජේකෝන්,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල්.

2014 මාර්තු මස 21 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

**ඇමුණුම් අංක 01**

දිස්ත්‍රික්කවල නම් හා ඒවාට අයත් අංක

(7.2 ඡේදයට අදාළ වේ)

| *දිස්ත්‍රික් අංක* | *දිස්ත්‍රික්කය* | *දිස්ත්‍රික් අංක* | *දිස්ත්‍රික්කය* |
|---|---|---|---|
| 01 | අනුරාධපුරය | 14 | ගම්පහ |
| 02 | බදුල්ල | 15 | කළුතර |
| 03 | මඩකලපුව | 16 | මාතලේ |
| 04 | කොළඹ | 17 | නුවරඑළිය |
| 05 | ගාල්ල | 18 | මන්නාරම |
| 06 | යාපනය | 19 | මුලතිව් |
| 07 | මහනුවර | 20 | අම්පාර |
| 08 | කුරුණෑගල | 21 | පුත්තලම |
| 09 | මාතර | 22 | පොලොන්නරුව |
| 10 | ත්‍රිකුණාමලය | 23 | මොණරාගල |
| 11 | වවුනියාව | 24 | කෑගල්ල |
| 12 | රත්නපුරය | 25 | කිලිනොච්චිය |
| 13 | හම්බන්තොට | | |

***ආදර්ශ ඉල්ලුම් පත්‍රය***

*ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2014*

*කෘෂිකර්ම නිෂ්පාදන තාක්‍ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2017*

(COMPETITIVE EXAMINATION FOR ADMISSION TO SRI LANKA SCHOOL OF AGRICULTURE - 2014

(National Diploma in Agricultural Production Technology - 2015/2017)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි).

1. *විභාගයට පෙනී සිටින නගරය :* | *එහි අංකය*
1 වැනි තේරීම ..................................................
2 වැනි තේරීම ..................................................
(ගැසට් පත්‍රයේ මුල් ඡේදයට අනුව)

2. *විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :*
සිංහල මාධ්‍යය - 2
දෙමළ මාධ්‍යය - 3 .........
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3. *පාඨමාලාව හැදෑරීමට කැමති මාධ්‍යය (පළමු වසර) :*
සිංහල මාධ්‍යය - 2
දෙමළ මාධ්‍යය - 3 .........
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1 .....
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5. සාමාන්‍ය පෙළ විභාගයට ප්‍රථම වරට පෙනී සිටි පාසල අයත්වන දිස්ත්‍රික්කය : ..................
දිස්ත්‍රික් අංකය : ............
(7.2 ඡේදයට අනුව/ඇමුණුම 01 බලන්න)

6. අ. පො. ස. (උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාව හදාරා සමත් වී ඇති විෂයයන් ගණන : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
විෂයයන් තුනක් එකවර - 3
විෂයයන් දෙකක් හෝ එකක් එකවර - 2
සමත් වූ විෂයයන් ගණනට අදාළ අංකය : ..................
(3.1 ඡේදයට අනුව)

7. (අ) (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(පැහැදිලි අකුරින්)
(ii) අගට යෙදූ මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :————.
*උදා.* : ANANDA, K. C. B.
(ආ) (i) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :————.

8. (i) සම්පූර්ණ ලිපිනය :————.
(ii) විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු සම්පූර්ණ ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :————.
(iii) සම්බන්ධ කරගත හැකි දුරකථන අංක : (i) ස්ථාවර
(ii) ජංගම

9. (අ) අ. පො.ස. (සා. පෙළ) විභාගයට පළමුවැනි වරට පෙනී සිටි පාසල හා ලිපිනය :————.
(ආ) පළමුවරට අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය (සිංහලෙන්) :——.
(ඇ) පළමුවරට අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය (ඉංග්‍රීසියෙන්) :—.

10. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

11. (අ) පදිංචි මැතිවරණ කොට්ඨාසය (සිංහලෙන්) :————.
(ආ) මැතිවරණ කොට්ඨාසය (ඉංග්‍රීසියෙන්) :————.

12. උපන් දිනය : අවුරුද්ද : | | | | | මාසය : | | | දිනය : | | |

13. 2014.05.31 වැනි දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |

14. අධ්‍යාපන සුදුසුකම් (ගැසට් නිවේදනයේ සඳහන් විස්තර අනිවාර්යයෙන් කියවා මෙම කොටස පිරවිය යුතුවේ.) :—

(අ)ගැසට් නිවේදනයේ 3.1 ඡේදය අනුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයන් හය හෝ ඊට වැඩි ගණන :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. | | |
| | | 2. | | |
| | | 3. | | |
| | | 4. | | |
| | | 5. | | |
| | | 6. | | |
| | | 7. | | |
| | | 8. | | |
| | | 9. | | |
| | | 10. | | |
| | | 11. | | |

(ආ)ගැසට් නිවේදනයේ 3.1 ඡේදය අනුව සම්මාන සාමාර්ථයන් ලබාගැනීම අනිවාර්ය කර ඇති විෂයයන් හතර පිළිබඳ විස්තර :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. | සිංහල | |
| | | 2. | ගණිතය | |
| | | 3. | විද්‍යාව | |
| | | 4. | කෘෂිකර්මය | |
| | | 5. | සමාජ අධ්‍යයනය | |
| | | 6. | ඉතිහාසය | |
| | | 7. | ජීවන නිපුණතා හා | |
| | | | පුරවැසි අධ්‍යාපනය | |
| | | 8. | කෘෂි ආහාර තාක්ෂණය | |
| | | 9. | උද්‍යාන විද්‍යාව | |

(ඇ) අ. පො. ස. (උ. පෙ.) විභාගය සඳහා ජීව විද්‍යා විෂයය ධාරාව හදාරා ඇත් ද? ඔව්/නැත (අදාළ නොවන වචනය කපා හරින්න.)
(ඈ) අ. පො. ස. (උ. පෙ.) විභාගයෙන් සමත් විෂයයන් :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | | 1. ජීව විද්‍යාව | |
| | | | 2. කෘෂිකර්මය | |
| | | | 3. භෞතික විද්‍යාව | |
| | | | 4. රසායන විද්‍යාව | |
| | | | 5. සත්ත්ව විද්‍යාව | |
| | | | 6. උද්භිද විද්‍යාව | |

(ඉ) ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවන්න.
(මුල් පිටපත් එවිය යුතු නොවේ.)
අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් අමුණා තිබේ ද? :————.

15. (i) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය (සිංහලෙන්) :————.
(ii) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්)

16. මුදල් ඇණවුම් පිළිබඳ විස්තර :
16.1 මුදල් ඇණවුම් අංකය :————.
16.2 මුදල් ඇණවුම නිකුත් කළ තැපැල් කාර්යාලය :————.
16.3 මුදල් ඇණවුම මාරුකරන කාර්යාලය :————.
(මෙය අනිවාර්යයෙන්ම පේරාදෙණිය තැපැල් කාර්යාලය විය යුතුයි.)

මුදල් ඇණවුමේ උඩ කොටසේ තීරුවක පමණක් මැලියම් ගා මෙහි අලවන්න.
එහි ඡායා පිටපතක් අනිවාර්යයෙන්ම ඔබ ළඟ තබාගන්න.

*අයදුම්කරුගේ ප්‍රකාශය :*

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති සියලුම විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මා අ. පො. ස. (සා. පෙළ) සමත් බවත්, සිංහල, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් ඇති බවත්, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය හෝ කෘෂි ආහාර තාක්ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයයන් හයෙන් එකකට සම්මාන සාමාර්ථයක් ඇති බවත් හා උසස් පෙළ ජීව විද්‍යා විෂයය ධාරාව හදාරා ගැසට් නිවේදනයේ නම් කර ඇති සියලුම සුදුසුකම් සපුරා ඇති බවටත් සහතික වෙමි. මෙහි සඳහන් කරුණු අසත්‍ය බව හෝ වැරදි බව හෝ හෙළි වුවහොත්, මා තරග විභාගයට පෙනී සිටීමට හා කෘෂිකර්ම විද්‍යාලයට තෝරා ගැනීමට නුසුදුස්සකු වන බව මම දනිමි. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති පිළිපැදීමට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**අධ්‍යාපන සුදුසුකම් හා අත්සන සහතික කිරීම**

(දෙපාර්තමේන්තුවක හෝ පාසලක ප්‍රධානියෙක්, සාමදාන විනිශ්චයකාරවරයෙක්, නීතිඥයෙක් හෝ රුපියල් 2,30,060ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු විසින් මෙම අයදුම්පත්‍රය සහතික කළ යුතුයි.)

ඉහතින් අත්සන් කර ඇති ................................ මයා./මිය./මෙනෙවිය මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි. තව ද, ගැසට් නිවේදනයේ සඳහන් අ. පො. ස. (සා. පෙළ) හා අ. පො. ස. (උසස් පෙළ) සුදුසුකම් ඇති බවට ගැසට් නිවේදනය හා අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් පරීක්ෂාකර බලා වගකීමකින් යුතුව සහතික කරමි. තව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත මෙම ඉල්ලුම් පතෙහි අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන,
සුදුසුකම් සහතික කරන අයගේ
නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
නිල නාමය :————.
ලිපිනය :————.
04-598

---

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2014

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.03.28 අංක 1856 දරන ගැසට් පත්‍රයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් කරනු ලබන නිවේදනයට සංශෝධනයයි

01. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2014.05.09 දිනය දක්වා දීර්ඝ කරනු ලැබේ.
02. උක්ත ගැසට් නිවේදනයේ ඇතුළත් පිටු අංක 8 හි 4 වැනි ඡේදයේ පාඨමාලා අංක 12 අවලංගු කරනු ලැබේ.
03. අදාළ ගැසට් නිවේදනයේ පිටු අංක 8 හි 4 වැනි ඡේදයේ අංක 11 සහ 12 ලෙස අභ්‍යාසලාභී පුහුණු පාඨමාලාවන් පහත පරිදි ඇතුළත් කරනු ලැබේ.

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ. පො. ස. (සා. පෙළ) සුදුසුකම් | අ. පො. ස. (උ. පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|
| 11 | කීට විද්‍යා සහකාර | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් එක් වරක දී සමත්වීම | * අයදුම් කළ හැක්කේ පුරුෂ පක්ෂයට පමණි |
| 12 | පාසල් දන්ත චිකිත්සක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම | * අයදුම් කළ හැක්කේ ස්ත්‍රී පක්ෂයට පමණි * උස අඩි 4 අඟල් 10ක් හෝ ඊට වැඩි විය යුතු ය * සියලුම අයදුම්කාරියන් අවිවාහක විය යුතු ය |

04. එම ගැසට් නිවේදනයේ පිටු අංක 8 හි 6 වැනි ඡේදයේ (ඇ) කොටස අවලංගු කරන අතර එය පහත පරිදි සංශෝධනය විය යුතු ය :-
6. (ඇ) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු හෝ සාමදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු හෝ නීතිඥවරයකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 273,060 ට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කළ යුතු ය.
05. උක්ත ගැසට් නිවේදනයේ අයදුම්පත්‍රයෙහි අංක 7, 8, 9 සහ 11 යන කරුණු සම්බන්ධයෙන් අදාල කොටුවේ ලකුණ යෙදිය යුතුවේ.
06. එම ගැසට් නිවේදනයේ පිටු අංක 8 හි 12 වැනි ඡේදයේ (i) කොටස අවලංගු කරන අතර, එය පහත පරිදි සංශෝධනය විය යුතු ය :-
12. (i) සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කරුවන් අතරින් තෝරාගත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් අදාළ පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ. පාඨමාලාවන් ඉහත ගැසට් නිවේදනයේ ඒ ඒ පාඨමාලාවන් ඉදිරියේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන්/මාධ්‍යයන්ගෙන් හැදෑරිය යුතු ය.
07. උක්ත ගැසට් නිවේදනයේ 13 (i) ලෙසට පහත සඳහන් කොටස ඇතුලත් විය යුතු ය :-
* සංකේත අංක 1, 2, 3, 4, 5 ලෙසින් වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවන් හා සංකේත අංක 9, 10, 11, 12 ලෙසින් වූ අතුරු වෛද්‍ය සේවාවන් සඳහා iii ශ්‍රේණිය - රු. 15,440-5 x 180 - 5 x 240 - 11 x 320 - 20 x 360 - රු. 28,260
* සංකේත අංක 6 ලෙසින් වූ අතුරු වෛද්‍ය සේවාවන් සඳහා
iii ශ්‍රේණිය - රු. 15,260 - 6 x 180 - 4 x 240 - 11 x 320 - 20 x 360 x රු. 28,020
* සංකේත අංක 7, 8 ලෙසින් වූ අතුරු වෛද්‍ය සේවාවන් සඳහා
iii ශ්‍රේණිය - රු. 15,080 - 7 x 180 - 3 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,780

මෙම ගැසට් නිවේදනයෙන් ආවරණය නොවන ගැටළු සහගත යම් කරුණක් උද්ගත වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය, අවසාන තීරණය වනු ඇත.

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2014 අප්‍රේල් මස 09 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය ",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.
04-717

---

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මහජන බැංකුව - ආයතනික බැංකු අංශය**

වැල්ලම්පිටිය, කොටුවිල, හල්මුල්ල පාරේ පිහිටි වටිනා දේපළක් මිලදී ගැනීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

ප්‍රමාණය : අ. 0, රු. 01, පර්. 32.5

(1) ප්‍රධාන කළමනාකරු අයකිරීම් මහජන බැංකුව විසින් ඉහත සඳහන් දේපළ සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් කැඳවනු ලබයි.

(2) මුදලින් රු. 1,000 ක ආපසු නොගෙවන ලේඛන ගාස්තුවක් ගෙවීම මත 2014.05.15 වැනි දින තෙක් වැඩකරන දිනයන්හි දී පෙ. ව. 9.00 සිට ප. ව. 4.00 දක්වා අතර කාලයේ මහජන බැංකුව, ආයතනික බැංකු අංශය, කළමනාකරුගෙන් ටෙන්ඩර් ලේඛන ලබාගත හැක.

(3) ටෙන්ඩර් ලේඛන 2014.05.01 වැනි දින සිට 2014.05.15 වැනි දින දක්වා වැඩ කරන දිනයන්හි දී පෙ. ව. 9.00 සිට ප. ව. 4.00 දක්වා කාලය තුළ දී නිකුත් කරනු ඇත.

(4) ටෙන්ඩරය 2014.05.15 වැනි දින පෙ. ව. 10.00 ට අවසන් කරනු ඇති අතර ප. ව. 2.30 ට මහජන බැංකුව, ආයතනික බැංකු අංශය හි දී විවෘත කරනු ලැබේ.

(5) කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවත, අංක 35 හි ආයතනික බැංකු අංශය, කළමනාකරු අයකිරීම් වෙතින් වැඩිදුර විස්තර ලබාගත හැක.

දුරකථන අංකය : 011 - 2424733/001-2481668.
අවසාන දිනය : 2014 මැයි මස 15

ප්‍රධාන කළමනාකරු (අයකිරීම්).

මහජන බැංකුව ප්‍රධාන කාර්යාලය,
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.
දුරකථන අංකය : 011- 2481668.
04-778

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**
**ප්‍රසම්පාදන දැන්වීම**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත ටොන් 10 ධාරිතාවේ ට්‍රැක් ජැක් 60ක් සැපයීමේ ප්‍රසම්පාදනය**

(01) ටොන් 10 ධාරිතාවේ ට්‍රැක් ජැක් 60ක් මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු (ප්‍රධාන) ප්‍රසම්පාදන කමිටුවේ, සභාපති තැන විසින් නිෂ්පාදකයින්/ සැපයුම් කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු සඳහා දැන් ඇරයුම් කෙරේ.

(02) 2014.05.07 වැනි දින ශ්‍රී ලංකාවේ වේලාවෙන් ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කරනු ලැබේ.

(03) ආපසු නොගෙවන රු. 3,000 ක් හෝ නිදහසේ පරිවර්තනය කළ හැකි සමාන මුදල් වර්ගයකින් ලියවිලි ගාස්තුව ගෙවා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් හෝ විදේශීය ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් ලබාගත් ආකෘති පත්‍ර මත පමණක් සටහන් කළ ලංසු පමණක් භාරදිය යුතුයි.

(04) ලංසු භාරගැනීම අවසන් කළ වහාම ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, සාමාන්‍යාධිකාරි තැනගේ කාර්යාලයේ දී එම ලංසු විවෘත කරනු ලැබේ. මෙම ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට සහභාගි වන ලෙස ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ රැගෙන විත් පහත ලිපිනයට භාරදිය යුතුයි.

සභාපති,
දෙපාර්තමේන්තු (ප්‍රධාන) ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත,
කොළඹ 10,
ශ්‍රී ලංකාව.

06. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු ලියවිලි ගාස්තුවකින් තොරව පරීක්ෂාකර බැලිය හැකි අතර, වැඩිමනත් තොරතුරු සඳහා කරුණාකර පහත සඳහන් ලිපිනය හෝ දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2436818, ෆැක්ස් අංක : 94 (11) 2432044 ඔස්සේ අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරි තැන,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කට් මාවත,
කොළඹ 10,
ශ්‍රී ලංකාව.

සභාපති තැන,
දෙපාර්තමේන්තු (ප්‍රධාන) ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F 7105
04-683

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**
**ප්‍රසම්පාදන දැන්වීම**
**ශ්‍රී ලංකා දුම්රිය සේවයට සිදුරු හයකින් සමන්විත පූට්ටු තහඩු**
රාත්තල් 90 (A) යුගල 1,000ක් ප්‍රසම්පාදනය කිරීම

01. සිදුරු 06කින් සමන්විත පූට්ටු තහඩු 90 (A) Ibs යුගල 1,000ක් මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ ශ්‍රී ලංකා දුම්රිය සේවා දුම්රිය මූලස්ථානයෙහි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති (මේජර්) විසින් මුද්‍රා තබන ලද ලංසු නිෂ්පාදකවරුන්ගෙන්/ සැපයුම්කරුවන්ගෙන් භාරගනු ලබයි.

ලංසුකරුවන් ඔවුන්ගේ ලංසු ඍජුවම හෝ ශ්‍රී ලංකාවෙහි ලියාපදිංචි වී ඇති සහ ඇටෝර්නි බලපත්‍රයක් මාර්ගයෙන් බලය ලබාදී ඇති පිළිගත් නියෝජිතයෙකු මගින් ඉදිරිපත් කළ යුතු ය.

(02) රු. 3,000.00ක් හෝ ඒ හා සමාන පහසු පරිවර්ථිත ආපසු ගෙවනු නොලබන ලියකියවිලි ගාස්තුවක් ගෙවා ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් හෝ ශ්‍රී ලංකාවේ විදේශීය දූත මණ්ඩලවලින් 2014.05.20 වැනි දින ප. ව. 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) තෙක් ලබාගත හැකි පෝරම මත පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

(03) 2014.05.21 වැනි දින ප. ව. 2.00 ට (ශ්‍රී ලංකා වේලාවෙන්) ලංසු භාරගැනිම අවසන් වේ.

(04) සිදුරු 06කින් සමන්විත පූට්ටු තහඩු – 90 (A) Ibs සැලසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ සැපයීම භාරගත යුත්තේ ISO 9001 : 2008 තත්ත්වය ඇති බවට සහතික කරනු ලැබූ හෝ මිලදී ගන්නාට පිළිගත හැකි ඒ හා සමාන ජාත්‍යන්තර තත්ත්ව කළමනාකරණ පද්ධති ප්‍රමිතියක් ඇති ආයතන විසින් පමණි.

(05) ලංසු භාරගැනීම අවසන් වූ වහාම, ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය මූලස්ථානයේ දී ලංසු විවෘත කිරීම සිදු කරනු ලැබේ. මෙම අවස්ථාවට පැමිණෙන ලෙසට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ආරාධනය කරනු ලැබේ.

06. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ අතින් ගෙනැවිත් පහත සඳහන් ලිපිනයට භාරදිය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10,
ශ්‍රී ලංකාව.

07. ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ගාස්තු ගෙවීමකින් තොරව සිදුකළ හැකි අතර වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අය විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරි,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ඕල්කට් මාවත, කොළඹ 10,
ශ්‍රී ලංකාව.
දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2436818.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : එස්ආර්එස්/එෆ්. 7121.
04-684

---

**ප්‍රසම්පාදන දැන්වීම**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය**
**බිටුමිනස් කෝටඩ් ඉලාස්ටික්**
**රේල් ක්ලිප්ස් 600,000 ක් සැපයීම**

(01) ස්ථිර ආකාරයට රීරේලින් හා රී ස්ලිපරින් කිරීම සඳහා ඉලාස්ටික් රේල් ක්ලිප්ස් 600,000ක් සැපයීමට ශ්‍රී ලංකාව, කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ අංක 01 දරන ස්ථානයේ ප්‍රවාහන අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති තැන විසින් නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු සඳහා දැන් ඇරයුම් කෙරේ. ලංසුකරුවන්ට තම ලංසු ඍජුවම භාරදීම හෝ ශ්‍රී ලංකාවේ පිළිගත් හා ඇටෝර්නි බලය පැවරූ නියෝජිතයෙකු මගින් තම ලංසු මගින් භාරදිය හැක.

(02) ආපසු නොගෙවන ලියවිලි ගාස්තුව වූ ශ්‍රී. ල. රු. 3,000ක් හෝ නිදහසේ පරිවර්තනය කළ හැකි සමාන මුදල් වර්ගයකින් ගෙවා 2014.04.29 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන් ප. ව. 3.00 ට පෙර ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් හෝ ශ්‍රී ලංකා විදේශීය තානාපති කාර්යාලවලින් ලබාගත් ආකෘතිපත්‍ර මත සටහන් කළ ලංසු පමණක් භාරදිය යුතු ය.

(03) මිලදී ගන්නාට පිළිගත හැකි ISO 9001 : 2008 ප්‍රමිති සහතික ලත් සමාගම් වලින් නිෂ්පාදනය කරනු ලැබූ ඉලාස්ටික් රේල් ක්ලිප්ස් පමණක් භාරගනු ලැබේ.

(04) 2014.04.30 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන් ප. ව. 2.00 ට ලංසු භාර ගැනීම අවසන් කෙරේ. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ රැ ගෙන විත් පහත ලිපිනයට භාරදිය යුතු ය.

සභාපති තැන,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන අමාත්‍යාංශය,
අංක 01, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.

05. ලංසු භාරගැනීම අවසන් කළ වහාම ඉහත ඡේද 4 හි දැක්වෙන ලිපිනයේ දී ලංසු විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට සහභාගි වන ලෙස ලංසුකරුවන්ගෙන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට දන්වා සිටිනු ලැබේ.

07. ශ්‍රී ලංකාව කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ගාස්තුවකින් තොරව ලංසු ලියවිලි පරීක්ෂා කර බැලිය හැක. වැඩිමනත් තොරතුරු සඳහා කරුණාකර පහත සඳහන් ලිපිනය අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347,
ඕල්කට් මාවත, කොළඹ 10,
ශ්‍රී ලංකාව.
දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2436818.
ෆැක්ස් අංකය : 94 (11) 2432044.
යොමු අංකය : SRS/F.7095.

සභාපති තැන,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

04-685

---

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - කෑගල්ල**
අධිකරණයට ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2014.05.10 වෙනි දින පෙරවරු 10.30 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට කලින් ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩයන් මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩයන් සඳහා එවෙලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිල දී ගනු ලබන සෑම අයෙකු ම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, මිලදී ගන්නා භාණ්ඩ සියල්ල එදින පස්වරු 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

ප්‍රසන්න අල්විස්,
මහෙස්ත්‍රාත්.

2014 අප්‍රේල් මස 03 වැනි දින,
කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි 2014 - මැයි**

| අනු. අංකය | නඩු අංකය | වෙන්දේසි භාණ්ඩය පිළිබඳ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | අංක රහිත | කාර් රථ සඳහා යොදන බැටරි | 01 |
| 02. | AR 7128/14 | නිල් පැහැති හෙල්මට් | 01 |
| 03. | AR 6984/14 | ජංගම දුරකථන | 01 |
| 04. | AR 6892/13 | යකඩ මුල්ලු | 01 |
| 05. | AR 6852/13 | ඉස්කුරුප්පු නියන් | 01 |
| | | යකඩ බට | 01 |
| 06. | AR 6812/13 | ඉස්කුරුප්පු නියන් | 01 |
| 07. | AR 6891/13 | පිහි | 01 |
| 08. | AR 6810/13 | අලවංගු | 01 |
| 09. | AR 5833/13 | විවිධ හඳුනාගැනීමේ සලකුණු සහිත | |
| | | රබර් ෂීට් | තොගය |
| 10. | AR 6937/13 | ගෑස් ලිප් | 01 |
| | | යකඩ පුනීල | 01 |
| 11. | AR 7249/14 | කොඩැක් වර්ගයේ කැමරා | 01 |
| 12. | AR 5896/13 | ඩිජිටල් වර්ගයේ යකඩ සේප්පු | 01 |
| 13. | AR 5950/13 | යකඩ දම්වැල් | 02 |
| 14. | AR 6045/13 | නැෂනල් වර්ගයේ ඉන්ඩෙක්ෂන් | |
| | | කුකර් ටෝසටර් | 01 |
| | | රයිස් කුකර් | 01 |
| 15. | AR 5897/13 | රූපවාහිනී යන්ත්‍ර | 01 |
| 16. | B 732/13 | කෝප්ප | 01 |
| 17. | 17905/13 | විදුලි පන්දම් | 01 |
| 18. | B 3523/12 | යකඩ කැබලි | 02 |
| 19. | B 4962/13 | යකඩ පොරව | 01 |
| 20. | B 3229/12 | විදුලි පන්දම් | 01 |
| 21. | AR 6984/14 | ජංගම දුරකථන | 01 |
| 22. | 23447/14 | ටෝච් | 01 |
| 23. | 23236/14 | ජල කරාම | 01 |
| 24. | 23239/14 | ළමා සෙරෙප්පු කුට්ටම් | 01 |
| 25. | 11413/11 | ජංගම දුරකථන | 01 |
| 26. | 23240/14 | බවුත් | 01 |
| 27. | 24017/14 | ජල කරාම | 01 |
| 28. | 19984/13 | රිචාජබල් | 01 |
| 29. | 23065/14 | රිචාජබ් ටෝච් | 01 |
| 30. | 19776/13 | ජල කරාම | 01 |
| 31. | 19561/13 | ජල කරාම | 01 |
| 32. | 20498/13 | හීටරය | 01 |
| 33. | 18705/13 | මල්ටි ප්ලග් | 01 |
| 34. | 18811/13 | මල්ටි ප්ලග් | 01 |
| 35. | 21031/13 | රිචාජබල් ටෝච් | 01 |
| 36. | 18700/13 | රිචාජබල් ටෝච් | 01 |
| 37. | 23053/14 | විදුලි පන්දම් | 01 |
| 38. | 10295/11 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් | 01 |
| 39. | 21909/13 | රවුම් කියත් තලයක් සහිත ඉරුම් මේස | |
| | | බෙල්ට් | 03 |
| 40. | 19665/13 | අත් ට්‍රැක්ටර් | 01 |
| | | රවුම් කියත් තලය හා ඉරුම් මේස | 01 |
| 41. | 21133/13 | අංක රහිත අත් ට්‍රැක්ටර් | 06 |
| | | රවුම් කියත් තලය සහිත ඉරුම් මේස | 01 |
| | | බෙල්ට | 02 |
| 42. | 16206/12 | අත් ට්‍රැක්ටර් (පිටුපස ටේලරය සමග) | 01 |
| 43. | 8436/11 | යතුරු පැදි | 01 |
| 44. | B 4156/13 | යතුරු පැදි | 01 |
| 45. | 22631/13 | ලෝහ ටැංකිය | 01 |
| | | හුලංග පොම්පය | 01 |
| | | ගෑස් ලිප් | |
| 46. | 10074/09 | ටකරං | 03 |
| 47. | AR 5895/13 | ජංගම දුරකථන | 02 |
| 48. | AR 5900/13 | ජංගම දුරකථන | 01 |
| 49. | AR 6042/13 | ජංගම දුරකථන | 01 |
| 50. | AR 6043/13 | ජංගම දුරකථන | 01 |
| 51. | AR 6044/12 | ජංගම දුරකථන | 01 |
| 52. | AR 5899/13 | ජංගම දුරකථන | 02 |
| 53. | AR 5898/13 | අත් ඔරලෝසු | 01 |
| 54. | AR 5785/13 | ජංගම දුරකථන | 01 |
| 55. | 20093/13 | ගෑස් සිලින්ඩර් | 02 |
| 56. | 16627/12 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | රෙගියුලේටර් සහිත ගෑස් ලිප් | 01 |
| 57. | 15417/12 | ගෑස් සිලින්ඩර් | 01 |
| 58. | 19417/13 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | රෙගියුලේටර් සහිත ගෑස් ලිප් | 01 |
| 59. | 23963/14 | බාස්කට් | 02 |
| 60. | 23957/14 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 61. | අංක රහිත | යකඩ බැරල් | 50 |
| 62. | අංක රහිත | ප්ලාස්ටික් බැරල් | 25 |
| 63. | අංක රහිත | ප්ලාස්ටික් බූලි | 250 |
| 64. | අංක රහිත | ප්ලාස්ටික් කෑන් | 200 |
| 65. | අංක රහිත | හිස් වීදුරු බෝතල් | තොගය |
| 66. | අංක රහිත | ඇලුමිනියම් මුට්ටි | 50 |
| 67. | අංක රහිත | රිචාචබල් ටෝච් | 02 |
| 68. | අංක රහිත | ඉවත් කරන ලද විදුලි පංකා කොටස් | කිහිපයක් |
| 69. | අංක රහිත | ඉවත් කරන ලද ටියුබ්ලයිට් ආවරණ කොටස් | කිහිපයක් |
| 70. | අංක රහිත | වහලය අලුත්වැඩියා කිරීමේ දී ඉවත් කරන ලද ෂීට් කැබලි සහ දිරාපත් ලෑලි කොටස් | කිහිපයක් |

04-608

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - පොතුවිල්**
රාජසන්තක හා මෙතෙක් හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ වෙන්දේසි කිරීම

01. පොතුවිල් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක හා මෙතෙක් හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ 2014.04.26 වැනි දින පෙ. ව. 10.00 ට පොතුවිල් පැරණි අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. භාණ්ඩවලට හිමිකම් දක්වන අයෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින හෝ එදිනට පෙර ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණය වෙත සනාථ කළ යුතු ය.

03. අධිකරණ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුගේ අවසරය ඇතිව වෙන්දේසි දින පෙ. ව. 9.30 සිට වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂාකර බැලිය හැක.

04. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන ද්‍රව්‍ය එවෙලේ ම මුදල් ගෙවා ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

05. අධිකරණය විසින් තීරණය කරන ලද අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතු වේ.

06. වෙන්දේසියෙන් මිල දී ගන්නා ලද ද්‍රව්‍යයන් සඳහා ගැණුම්කරු විසින් තමන්ගේ අනන්‍යතාව තහවුර කිරිම සඳහා පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

07. වෙන්දේසිය පිළිබඳ පැමිණිලි කිසිවක් වෙතොත් එදින වෙන්දේසියේ රාජකාරි අවසන් වීමට පෙර අධිකරණය වෙත දැන්විය යුතු අතර, පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

08. එම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳව සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදුකරන බව දන්වා සිටිමි.

09. වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ උපලේඛනය දෙමළ භාෂාවෙන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් වේ.

අයි. එන්. රිස්වාන්,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්.

2014 අප්‍රේල් මස 02 වැනි දින,
පොතුවිල් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.
04-609

---

**සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය - හෙල්බොඩ**
රාජසන්තක කරන ලද සහ හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. හෙල්බොඩ සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ අවසන් වූ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොපාන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2014.05.24 සෙනසුරාදා දින පෙ. ව. 10.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන තැනැත්තෙකු සිටී නම් වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 10.00ට පෙර ස්වකීය හිමිකම් තහවුරු කළ යුතු ය.

03. එදින පෙ. ව. 9.30 සිට පෙ. ව. 10.00 දක්වා මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසියට නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලන්සුව පිළි නොගන්නා අවස්ථාවල දී එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අභිමතය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදලින් ගෙවීම් කළ යුතු අතර, චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.

06. මිල දී ගන්නා භාණ්ඩ එදින ප. ව. 3.30ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

07. වෙන්දේසියේ දී භාණ්ඩ මිල දී ගැනීමට ඉදිරිපත්වන ගැණුම්කරුවන් විසින් තම අනන්‍යතාව තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත අනිවාර්යයෙන් ම ඉදිරිපත් කළ යුතු ය.

එල්. කේ. මහින්ද,<br>
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,<br>
දිසා මහෙස්ත්‍රාත් අධිකරණය,<br>
නාවලපිටිය.

2014 මාර්තු මස 27 වැනි දින,<br>
නාවලපිටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තර |
|---|---|---|
| 01. | බී 13/04 | කර්මාන්ත ශාලාවකට අයත් යකඩ තොගය |
| 02. | 29973 | කුළුගෙඩි 02යි, පීකස් 03, පිහියා 01, ගල් කටු 02යි, උදලු 01යි |
| 03. | 27460 | සවල් 01යි |
| 04. | 26051 | වක් පිහියා 01යි |
| 05. | 30331 | වක් පිහියා 01යි |
| 06. | 30114 | වක් පිහියා 01යි |
| 07. | 30822 | වක් පිහියා 01යි |
| 08. | 30823 | වක් පිහියා 01යි |
| 09. | 30824 | වක් පිහියා 01යි |
| 10. | 30825 | වක් පිහියා 01යි |
| 11. | 30378 | වක් පිහියා 01යි |
| 12. | 30376 | වක් පිහියා 01යි |
| 13. | 31533 | වක් පිහියා 01යි |
| 14. | අංක රහිත | යකඩ බට තොගය |
| 15. | 30377 | වක් පිහියා 01යි |
| 16. | අංක රහිත | සවල් 01යි |
| 17. | අංක රහිත | සවල් 01යි |
| 18. | අංක රහිත | උදලු 01යි |
| 19. | අංක රහිත | පිහියා 03යි |
| 20. | 30870 | විදුලි පන්දම් 01 |
| 21. | 30629 | ජංගම දුරකථන චාජර් 01යි |
| 22. | 31237 | විදුලි පන්දම් 01යි |
| 23. | 31941 | ජංගම දුරකථන චාජර් 01යි |
| 24. | 31253 | ජංගම දුරකථන චාජර් 01යි |
| 25. | 32395 | විදුලි පන්දම් 01යි |
| 26. | 32847 | ජංගම දුරකථන චාජර් 01යි |
| 27. | 31943 | ජංගම දුරකථන චාජර් 01යි |
| 28. | 31939 | විදුලි පන්දම් 01යි |
| 29. | 35128 | විදුලි පන්දම් 01යි |
| 30. | අංක රහිත | පොරෝ 04යි |
| 31. | 27455 | සවල් 01යි |
| 32. | අංක රහිත | උදලු 01යි |
| 33. | 28407 | සවල් 01යි |
| 34. | 31034 | උදලු 01යි |
| 35. | අංක රහිත | තැටි තරාදි 01, පඩි කිහිපයක්. |

04-601

---

**අබලි ද්‍රව්‍ය වෙන්දේසි කිරීම**

ත්‍රිකුණාමලය කොට්ඨාසයේ පොලිස් ස්ථානවල තිබූ පාවිච්චියට ගත නොහැකි පහත සඳහන් භාණ්ඩ ත්‍රිකුණාමලය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාල භූමියේ දී 2014.05.08 වැනි දින පෙ. ව. 9.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. 2014.05.08 වැනි දින පෙ. ව. 9.00 ට වෙන්දේසිය ආරම්භ කරන අතර, 2014.05.07 වැනි දින පැය 9.00 සිට 12.00 දක්වා භාණ්ඩ පරීක්ෂා කර බැලීමට පුළුවන. පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු ය.

02. මිලදී ගත් භාණ්ඩ සඳහා එදිනම මුදල් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

03. මිලදී ගත් භාණ්ඩ එදිනම කාර්යාල භූමියෙන් ඉවත්කර ගත යුතුයි. ඉන් පසු එම භාණ්ඩ පිළිබඳව වගකියනු නොලැබේ.

04. වෙන්දේසි කිරීම පිළිබඳව ඕනෑම කරුණක් සම්බන්ධයෙන් තීරණය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, ත්‍රිකුණාමලය කොට්ඨාස භාර සතුවේ.

| අනු. අංකය | භාණ්ඩයේ නම | ප්‍රමාණය |
|---|---|---|
| 01. | පොරෝ තල | 11 |
| 02. | ඇළුමිනියම් බේසම් | 01 |
| 03. | ඇළුමිනියම් පිඟන් | 63 |
| 04. | ඇළුමිනියම් කළ | 03 |
| 05. | ටී. වී. ඇන්ටනා | 01 |
| 06. | ඇළුමිනියම් මුට්ටි | 02 |
| 07. | පාපැදි | 13 |
| 08. | යකඩ පුටු | 134 |
| 09. | යකඩ කබඩ් | 01 |
| 10. | කොරොස් | 07 |
| 11. | අත්හිරමනා | 09 |
| 12. | ගෑස් ලිප් | 07 |
| 13. | යකඩ බාල්දි | 32 |
| 14. | ටකරන් කැබලි | 510 |
| 15. | ලන්තෑරුම් | 34 |
| 16. | නෑඹිලි | 08 |
| 17. | යකඩ වංගෙඩි | 01 |
| 18. | කැති | 02 |
| 19. | පිහියා | 38 |
| 20. | උදළු තල | 25 |
| 21. | මල්ටිපොට් | 01 |
| 22. | නන්ස්ටික් සෙට් | 01 |
| 23. | ඕපනර් | 05 |
| 24. | තෙල් තාච්චි | 20 |
| 25. | පිට්ටු බම්බු | 02 |
| 26. | ෆැක්ස් මැෂින් | 01 |
| 27. | ඉබි යතුරු | 01 |
| 28. | වාහන පරීක්ෂා කරන කණ්නාඩි | 01 |
| 29. | වානේ කබඩ් | 02 |
| 30. | යතුරුලියන | 28 |
| 31. | මේස | 01 |
| 32. | කූඩාරම් බට කට්ටල | 01 |
| 33. | විල්බැරෝ | 01 |
| 34. | විසි කැති | 16 |
| 35. | මාර්ග පරීක්ෂාකරන කොපු | 26 |
| 36. | රොටී කබල් | 02 |
| 37. | යකඩ ඉනි | 01 |
| 38. | කල්දේරම් | 115 |
| 39. | සවල් කැබලි | 05 |
| 40. | හැඳි | 227 |
| 41. | ස්ටීල් ලාම්පු | 06 |
| 42. | සිල්ව ට්‍රේ | 01 |
| 43. | සාස්පාන් සෙට් | 02 |
| 44. | ඉඳිආප්ප වංගෙඩි | 01 |
| 45. | වතුර ෆිල්ටර් | 17 |
| 46. | වතුර ටැප් | 03 |
| 47. | වතුර බොයිලේරු කනෙක්ටර් | 01 |
| 48. | රෝද පුටු | 04 |
| 49. | හුක් ඇන්ඩ් ලයින් | 01 |
| 50. | වායු සමීකරණ යන්ත්‍ර | 01 |
| 51. | රීලෙන්ඩර් | 01 |
| 52. | සිවිලිං විදුලි පංකා | 41 |
| 53. | පරිගණක යන්ත්‍ර | 01 |
| 54. | අධිශීතකරණ | 02 |
| 55. | විදුලි කියත් | 01 |
| 56. | විදුලි කේතල | 08 |
| 57. | විදුලි හිරමනා | 01 |
| 58. | විදුලි කේතල් හීටර් | 01 |
| 59. | හදිසි අවස්ථා ලාම්පු | 02 |
| 60. | විදුලි ඉස්ත්‍රික්ක | 03 |
| 61. | ෆැක්ස් යන්ත්‍ර | 05 |
| 62. | ඇලජන් ලාම්පු | 141 |
| 63. | හොට් ප්ලේට් | 01 |
| 64. | පරිගණක මොනිටර් | 01 |
| 65. | මැක් ලයිට් | 07 |
| 66. | නයිට් ඩ්‍රැගන් ලයිට් | 17 |
| 67. | ෆොටෝ කොපි යන්ත්‍ර | 03 |
| 68. | පරිගණක මුද්‍රණ යන්ත්‍ර | 01 |
| 69. | රයිස් කුකර් | 02 |
| 70. | රූපවාහිනී යන්ත්‍ර | 10 |
| 71. | රී චාජබල් ලාම්පු | 08 |
| 72. | රේඩියෝ කැසට් | 11 |
| 73. | රෝනියෝ යන්ත්‍ර | 01 |
| 74. | ටියුබ් ලයිට් සෙට් | 81 |
| 75. | විදුලි පන්දම් | 82 |
| 76. | මේස විදුලි පංකා | 11 |
| 77. | විදුලි වතුර බොයිලේරු | 17 |
| 78. | වතුර මෝටර් කුඩා | 04 |

04-636

---

**කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය**

**කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ, කාර්යාල භාවිතයෙන් හා ගොඩනැගිලි අලුත්වැඩියාවේ දී ගලවා ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

01. කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද හා නඩු අංක සොයාගත නොහැකි වූ නඩු භාණ්ඩ, කාර්යාල භාවිතයෙන් හා ගොඩනැගිලි අලුත්වැඩියාවේ දී ගලවා ඉවත් කරන ලද භාණ්ඩ 2014.05.10 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම්, ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 9.00 සිට පෙ. ව. 10.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර, වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ, ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවේ දී, අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

07. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

ගිහාන් පිලපිටිය,<br>
ප්‍රධාන මහෙස්ත්‍රාත්.

2014 අප්‍රේල් මස 25 වැනි දින,<br>
කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව**

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | 86048/01 | නොකියා වර්ගයේ ජංගම දුරකතන | 1 |
| 2. | 51388/01 | නොකියා වර්ගයේ ජංගම දුරකතන | 1 |
| 3. | 51388/01 | FXD නම සඳහන් ජංගම දුරකතන | 1 |
| 4. | 51388/01 | වෝඩාෆෝන් වර්ගයේ ජංගම දුරකථන | 1 |
| 5. | 51388/01 | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 1 |
| 6. | 51388/01 | M – phone නම සඳහන් ජංගම දුරකථන | 1 |
| 7. | 51388/01 | model 19 නම සඳහන් ජංගම දුරකථන | 1 |
| 8. | 51388/01 | වෝඩාෆෝන් වර්ගයේ ජංගම දුරකථන | 1 |
| 9. | 51388/01 | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 1 |
| 10. | 51388/01 | එනිකුල් වර්ගය සඳහන් ජංගම දුරකථන | 1 |
| 11. | 51388/01 | බ්ලූටූත් වර්ගය සඳහන් ජංගම දුරකථන | 1 |
| 12. | 51388/01 | මෝටරෝලා වර්ගයේ ජංගම දුරකථන | 1 |
| 13. | 51388/01 | බ්ලූටූත් වර්ගය සඳහන් ජංගම දුරකථන | 1 |
| 14. | 51388/01 | සිග්මටෙල් වර්ගයේ ජංගම දුරකථන | 1 |
| 15. | 51388/01 | මොබයිල් නම සඳහන් ජංගම දුරකථන | 1 |
| 16. | 51388/01 | බ්ලූටූත් වර්ගය සඳහන් ජංගම දුරකථන | 1 |
| 17. | 51388/01 | මෝටරෝලා වර්ගයේ ජංගම දුරකථන | 1 |
| 18. | 51388/01 | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 1 |
| 19. | 51388/01 | සිග්මටෙල් වර්ගයේ ජංගම දුරකථන | 1 |
| 20. | 51388/01 | FXD නම සඳහන් ජංගම දුරකථන | 1 |
| 21. | 51388/01 | එරික්ෂන් වර්ගයේ ජංගම දුරකථන | 1 |
| 22. | 51388/01 | T. mobile නම සඳහන් ජංගම දුරකථන | 1 |
| 23. | 51388/01 | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 1 |
| 24. | 51388/01 | X – 21 නම සඳහන් ජංගම දුරකථන | 1 |
| 25. | 51388/01 | සෝනි එරික්ෂන් වර්ගයේ ජංගම දුරකථන | 1 |
| 26. | 51388/01 | LG වර්ගයේ ජංගම දුරකථන | 1 |
| 27. | 82647/01 | කාර් කැසට් | 1 |
| 28. | 1841/05 | යකඩ බැරල් | 2 |
| 29. | 1841/05 | ප්ලාස්ටික් බැරල් | 1 |
| 30. | 1841/05 | ගෑස් සිලින්ඩර් | 1 |
| 31. | 1841/05 | විවෘත ගෑස් ලිප් | 1 |
| 32. | අංක රහිත | මේස තරාදි | 1 |
| 33. | අංක රහිත | කම්ප්‍රෙෂර් | 1 |
| 34. | අංක රහිත | කුලුගෙඩි | 1 |
| 35. | අංක රහිත | කිලෝ 10 ක් පමණ බර විවිධ ප්‍රමාණයේ යකඩ කැබලි අඩංගු උර | 1 |
| 36. | අංක රහිත | ස්ටැන්ඩ් එක සහිත ගෑස් ලිප් | 1 |
| 37. | අංක රහිත | අබලන් ජැක් | 14 |
| 38. | අංක රහිත | වාහන බැටරි | 20 |
| 39. | අංක රහිත | අබලන් වතුර මෝටර් | 1 |
| 40. | අංක රහිත | වාහන මෝටර් | 1 |
| 41. | අංක රහිත | ලේත් මැෂිමක කොටස් | 2 |
| 42. | අංක රහිත | සාස් පාන් | 5 |
| 43. | අංක රහිත | අබලන් රයිස් කුකර් | 2 |
| 44. | අංක රහිත | අබලන් තාච්චි | 2 |
| 45. | අංක රහිත | ඇලුමිනියම් මුට්ටි | 1 |
| 46. | අංක රහිත | අබලන් කාර් කැසට් | 7 |
| 47. | අංක රහිත | කිලෝ 10ක් පමණ බර විවිධ ප්‍රමාණයේ යකඩ කැබලි අඩංගු උර | 1 |
| 48. | අංක රහිත | යකඩ රෝද | 3 |
| 49. | අංක රහිත | රෙදි මහන මැෂිමක කොටස් | 1 |
| 50. | අංක රහිත | අත්යන්ත්‍රයක කොටස් | 1 |
| 51. | අංක රහිත | සයිලන්සර් කොටස් | 1 |
| 52. | අංක රහිත | සොකැබ්සෝබර් කොටස් | 7 |
| 53. | අංක රහිත | කිලෝ 10 ක් පමණ බර විවිධ ප්‍රමාණයේ යකඩ කැබලි අඩංගු උර | 1 |
| 54. | අංක රහිත | පනිට්ටු | 4 |
| 55. | අංක රහිත | පලංචි ක්ලිප් | 155 |
| 56. | අංක රහිත | යකඩ රාමු | 3 |
| 57. | අංක රහිත | අබලන් හොට් ප්ලේට් | 1 |
| 58. | අංක රහිත | යූ හැඩැති යකඩ බාර් | 1 |
| 59. | අංක රහිත | එල් අයරින් කැබලි | 2 |
| 60. | අංක රහිත | යකඩ ගල් ඉනි | 2 |
| 61. | අංක රහිත | ක්ලච් ප්ලේට් | 65 |
| 62. | අංක රහිත | බෆර් කොටස් | 2 |
| 63. | අංක රහිත | ඇලුමිනියම් භාජන | 10 |
| 64. | අංක රහිත | ඇලුමිනියම් කොරොස් | 2 |
| 65. | අංක රහිත | ඇලුමිනියම් තාච්චි | 4 |
| 66. | අංක රහිත | අබලන් ලාම්පු සෙට් | 10 |
| 67. | අංක රහිත | කිලෝ 10ක් පමණ බර විවිධ ප්‍රමාණයේ යකඩ කැබලි අඩංගු උර | 1 |
| 68. | අංක රහිත | පදම් කරන ලද දිරාගිය හම් කොටස් | 20 |
| 69. | අංක රහිත | ෆෝමිකා රෝල් | 1 |
| 70. | අංක රහිත | අබලන් රේඩියෝ | 2 |
| 71. | අංක රහිත | කුඩා ඇම්ප් | 3 |
| 72. | අංක රහිත | අබලන් දුරකතන | 9 |
| 73. | අංක රහිත | සිවිලින් ෆෑන් පෙති | 21 |
| 74. | අංක රහිත | කුඩා වයර් රෝල් | 20 |
| 75. | අංක රහිත | වායුසමීකරණ යන්ත්‍රයක කොටස් | 1 |
| 76. | අංක රහිත | හොල්ඩර් හා බල්බ් අඩංගු ලයිට් වැල් | 2 |
| 77. | අංක රහිත | කිලෝ 10ක් පමණ බර විවිධ ප්‍රමාණයේ යකඩ කැබලි අඩංගු උර | 1 |
| 78. | අංක රහිත | වාහන සංඥා ලාම්පු | 50 |
| 79. | අංක රහිත | වාහන පැති කණ්නාඩි | 50 |
| 80. | අංක රහිත | සෝනි වර්ගයේ අබලන් සෙටප් | 1 |
| 81. | 52626/4 | අඟල් 14 ෂාප් වර්ගයේ රූපවාහිනී | 1 |
| 82. | 52626/4 | ඉලෙක්ට්‍රික් අවන් | 1 |
| 83. | 52626/4 | අබලන් ස්ටැන්ඩ් ෆෑන් | 1 |
| 84. | AR7717/4 | යකඩ කපන කියත් තල | 4 |
| 85. | AR7717/4 | ප්ලාස්ටික් මිට සහිත පේපර් කටර් | 1 |
| 86. | AR7713/4 | ප්ලාස්ටික් මිට සහිත පේපර් කටර් | 1 |
| 87. | AR7716/4 | සෙ. මී. 40 දිග යකඩ පොලු | 1 |
| 88. | AR7462/4 | නිල් පාට ෂෙල් ගෑස් සිලින්ඩර් | 2 |
| 89. | AR7461/4 | නිල් පාට ෂෙල් ගෑස් සිලින්ඩර් | 1 |
| 90. | AR7460/4 | ටොයොටා වර්ගයේ පැති කණ්නාඩි | 2 |
| 91. | 29080/5 | ක්‍රිකට් පිති | 1 |
| 92. | AR7723/4 | ක්‍රිකට් පිති | 1 |
| 93. | 51590/4 | තණකොළ කපන යන්ත්‍ර | 1 |
| 94. | 31282/4 | සෝනි වර්ගයේ වී. සී. ඩී. යන්ත්‍ර | 1 |
| 95. | 49900/4 | විවිධ වීදුරු භාණ්ඩ අඩංගු පෙට්ටි | 1 |
| 96. | B 5833/1 | බිත්ති ලාම්පු | 1 |
| 97. | B 5523/3 | විදුලි පංකා | 1 |
| 98. | B 5523/3 | කලු පාට යකඩ ගේට්ටු පියන් | 2 |
| 99. | B 5524/3 | මල් කපන කතුරු | 1 |
| 100. | B 5524/3 | මුල්ලු | 1 |
| 101. | B 5524/3 | සිවිලිං ෆෑන් | 1 |
| 102. | B 6389/3 | ග්‍රයින්ඩරයක කොටස් | 1 |
| 103. | B 6389/3 | මුල්ලු | 1 |
| 104. | B 6389/3 | කටර් අඬු | 1 |
| 105. | B 6389/3 | විදුලි ස්ත්‍රික්ක | 1 |
| 106. | B 6389/3 | හිසකෙස් වියලන මැෂින් | 1 |
| 107. | B 6389/3 | අත් කියත් | 1 |
| 108. | B 6389/3 | ස්කුරුප්පු නියන් | 1 |
| 109. | B 3370/3 | ඩී. වී. ඩී. යන්ත්‍ර | 1 |
| 110. | B 3314/3 | කුඩා ගුවන් විදුලි යන්ත්‍ර | 1 |
| 111. | B 7775/3 | මේස විදුලි පංකා | 1 |
| 112. | B 7775/3 | පිත්තල මල් වාස් | 1 |
| 113. | B 7775/3 | කැසට් යන්ත්‍ර | 1 |
| 114. | අංක රහිත | යකඩ බාල්දි | 5 |
| 115. | 27633/6 | මීටර් 1 1/2ක් දිග, මීටර් 1 1/2ක් පමණ පළල රෙදි කැබලි | 30 |
| 116. | 27633/6 | ෂර්ට් හැගර් | 6 |
| 117. | 27633/6 | විවිධ වර්ගයේ ජල කරාම | 15 |
| 118. | 27633/6 | ලොකු ප්ලාස්ටික් බොත්තම් අඩංගු පැකට් | 1 |
| 119. | අංක රහිත | වාහන ජැක් | 1 |

**ගොඩනැගිලි අලුත්වැඩියාවේ දී ගලවා ඉවත් කරන ලද භාණ්ඩ**

| | | |
|---|---|---|
| 120. | විවිධ ප්‍රමාණයේ දිගැති බාල්ක | 4 |
| 121. | අබලන් උළුවහු කොටස් | 3 |
| 122. | අඩි 02 x 02 ප්‍රමාණයේ රිප්ප | 17 |
| 123. | අඩි 02 x 02 ප්‍රමාණයේ පරාල ලී | 22 |
| 124. | වඩිංගු ලී කැබලි | 2 |
| 125. | මුදුන් උළු කැට | 24 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 126. | | අඩි 03 x 06 ප්‍රමාණයේ විදුරු සහිත දොරවල් | 1 |
| 127. | | අඩි 1 1/2 x 04 ප්‍රමාණයේ විදුරු සහිත ජනෙල් පියන් | 2 |
| 128. | | අඩි 6 1/2 ක් පමණ දිග ඇලුමිනියම් පටි | 1 |
| 129. | | අඩි 1 1/2 x 04 පමණ ප්‍රමාණයේ ලී දොරවල් | 1 |
| 130. | | ජල කරාම | 1 |
| | | **කාර්යාල භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ** | |
| 131. | | ඡායා පිටපත් යන්ත්‍ර | 1 |
| 132. | | ෆැක්ස් යන්ත්‍ර | 2 |
| 133. | | පරිගණක මොනිටර් | 5 |
| 134. | | පරිගණක සී. පී. යූ. | 2 |
| 135. | | පරිගණක ප්‍රින්ටර් | 5 |
| 136. | | පරිගණක යූ. පී. එස්. | 5 |
| 137. | | රිසෝග්‍රාෆ්ට් යන්ත්‍ර | 1 |

04-625

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**මඩකලපුව දිස්ත්‍රික්කය - ඒරාවූර් පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**
රා තැබෑරුම් රේන්ද විකිණීම - 2014/2015 වර්ෂය
**2014 ජූලි මස 01 සිට 2015 ජුනි මස 30 දක්වා - ආරුමුගත්තාන් කුඩියිරුප්පු රා තැබෑරුම් රේන්ද විකිණීම**

අංක 207 දරන 1982.08.20 දින ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළ කරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධානයේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආරුමුගත්තාන් කුඩියිරුප්පු රා තැබෑරුම් සඳහා 2014 ජූලි මස 01 වැනි දින සිට 2015 ජුනි මස 30 වැනි දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් විසින් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතු ය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රු. 1,500 ක මුදලක් ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් නමින් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉල්ලුම්පත ලබා ගත හැකි ය. ටෙන්ඩර්පත් සමග රිසිට්පත අමුණා තිබිය යුතු ය. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2014 මැයි 05 දින සිට 2014 මැයි මස 16 වැනි දින ප. ව. 3.00 දක්වා පමණි.

02. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් බදු පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% කට නොඅඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් සහතිකය ටෙන්ඩර්පත්‍රය සමග ඇමිණිය යුතු ය.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේ නම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් නොකර ටෙන්ඩර්පත්‍ර සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කරන ලද දින සිට සති දෙක ඇතුළත ඔබ විසින් ලබාගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත් සමග නැවත ඉදිරිපත් කරන්නේනම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

05. දැනට තිබෙන තැබෑරුම් ඉඩම් ඉදිරි කාලවලටත් තිබේදැයි සහතික නැත.

06. ලියාපදිංචි කරන ලද පොල් සහ තල් සංගම් මෙම රේන්ද විකිණීමේ දී සහභාගි වන්නේ නම් සංගම පිහිටා තිබෙන ප්‍රදේශයට රා තැබෑරුමට පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ හැකි ය. ඒ සමග සංගම දැනට ක්‍රියාත්මක වන බවටත් සංගමය විසින් රා තැබෑරුම් බදු ගෙන පවත්වා ගෙන යාමට හැකියාව තිබීම සම්බන්ධව මඩකලපුව දිස්ත්‍රික් සමුපකාර සහකාර කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 දරන හා 2012.01.05 වැනි දිනැති චක්‍රලේඛයට අනුව).

07. අනිකුත් තොරතුරු ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

යූ. උදයශ්‍රීදර්,
ප්‍රාදේශීය ලේකම්.

2014 අප්‍රේල් මස 02 වැනි දින,
ඒරාවූර් පත්තුව,
වෙංකලඩි.

**රා තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය**

| *තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුමේ අංකය* | *ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* — *දිනය* | *වේලාව* |
|---|---|---|---|
| ආරුමුගත්තාන් කුඩියිරුප්පු | TT No. 1 | 2014.05.21 | පෙ. ව. 10.00 |

සටහන .- 1. ටෙන්ඩර් කමිටුව 2014.05.21 වැනි දින පෙ. ව. 10.00 ට රැස්වේ.

2. විකුණුම් දිනයේ සුදුසු බදුකරු තෝරා නොගත්තොත් නැවත විකිණීම 2014.06.04 වැනි දින ප. ව. 2.00 ට පැවැත්වේ.

04-597

---

මගේ අංකය : ආර/ආ/02/රා රේන්ද.

**ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**
රා තැබෑරුම් රේන්ද විකිණීම 2014/2015 වර්ෂය
**2014 ජූලි සිට 2015 ජුනි දක්වා**

2014 ජූලි 01 දින සිට 2015 ජුනි 30 දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසයෙන් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

3. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක ............. රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2014.05.21 වැනි දින පෙ. ව. 10.30 ට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

4. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

5. 2014.05.21 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩර්පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ තැබෑරුම සඳහා නැවත විකිණීම 2014.06.05 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම යථෝක්ත ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

6. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

එච්. එස්. එස්. ලූසේනා,
ප්‍රාදේශීය ලේකම්,

ආරච්චිකට්ටුව.
2014 අප්‍රේල් මස 25 වැනි දින.

**උපලේඛනය**

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් කළ යුතු මුදල රු. ශත* |
|---|---|---|---|---|
| අනවිලුන්දන් | කරුකුපනේ | 10 | 2014.05.21 පෙ. ව. 10.30 | 1,000 0 |
| ආනවිලුන්දන් | ආරච්චිකට්ටුව | 11 | 2014.05.21 පෙ. ව. 10.30 | 1,000 0 |
| ආනවිලුන්දන් | බත්තුළුඔය | 12 | 2014.05.21 පෙ. ව. 10.30 | 1,000 0 |

04-772

# රජයේ නොවන දැන්වීම්

**දැන්වීමයි**
**2007 අංක 07 දරන සමාගම් පනත**
පෙරිටස් බිස්නස් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - පී වී 94751

ඉහත සඳහන් සමාගම 2013 ඔක්තෝබර් මස 02 වැනි දින සංස්ථා ගත කළ බව සහ මෙහි ලියාපදිංචි කාර්යාලය අංක 905/29, ශාන්තිපුර, මාලඹේ ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමි.

කසුන් පෙරේරා,
සමාගමේ ලේකම්.

අංක 436/5, හිඹුටාන පටුමග,
අංගොඩ.

04-603

---

**දැන්වීමයි**
**2007 අංක 7 දරන සමාගම් පනත**
ජිෆෙලා ලැබ් (ප්‍රයිවට්) ලිමිටඩ් - පී වී 96345

ඉහත සඳහන් සමාගම 2014 ජනවාරි මස 02 වැනි දින සංස්ථා ගත කළ බව සහ මෙහි ලියාපදිංචි කාර්යාලය අංක 240/2/ඒ, මත්තෙගොඩ, පොල්ගස්ඕවිට ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමි.

කසුන් පෙරේරා,
සමාගමේ ලේකම්.

අංක 436/5, හිඹුටාන පටුමග,
අංගොඩ.

04-604

---

**දැන්වීමයි**

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 7 දරන නව සමාගම් පනතේ 9 වැනි වගන්තියට අනුව පහත සඳහන් සමාගම නීත්‍යානුකූල සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

සමාගමේ නාමය : හොටෙල් සප්ලයිස් ඒෂියා (පුද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 97087
සමාගමේ ලියාපදිංචි දිනය : 2014.02.18
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 49, පළමු වන ටෙම්පලර්ස් මාවත, ටෙම්පලර්ස් පාරෙන් එහා, ගල්කිස්ස.

මාණ්ඩලික නියෝගයක් මත ඒ. එෆ්. ඒ.
කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගමේ ලේකම්වරු.

04-605/1

---

**දැන්වීමයි**

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 7 දරන නව සමාගම් පනතේ 9 වැනි වගන්තියට අනුව පහත සඳහන් සමාගම නීත්‍යානුකූල සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

සමාගමේ නාමය : කොමර්ෂල් කෙමිකල් මැනුෆැක්චරස් (පුද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 97179
සමාගමේ ලියාපදිංචි දිනය : 2014.02.20
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 14, ශ්‍රී ධර්මකිර්තියාරාම පාර, කොළඹ 03.

මාණ්ඩලික නියෝගයක් මත ඒ. එෆ්. ඒ.
කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගමේ ලේකම්වරු.

04-605/2

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

ලුණුවිල, දෙමටපිටය කනත්ත පාර, අංක 84/4 හි පදිංචි අලහකෝන් ආරච්චිගේ සෝමලතා වන මම ශ්‍රී ලංකා ජනරජයටත් සාමාන්‍ය ජනතාවටත් කරන ලද දැනුම් දීම නම් ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. රොෂාන් නිලන්ත ප්‍රනාන්දු මහතා විසින් ලියා සහතික කරන ලද අංක 5010 සහ 2010.08.18 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටෝර්නි බලකාර තැන වශයෙන් ලුණුවිල දෙමටපිටය බෞද්ධ කනත්ත පාර හි පදිංචි අලහකෝන් ආරච්චිගේ විමලචන්ද්‍ර පත් කරනු ලැබූ අතර මෙතැන් පටන් එම පත් කිරීම අවලංගු කරන බව මෙසේ දැනුම් දෙමි.

04-616

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

ලුණුවිල, දෙමටපිටය බෞද්ධ කනත්ත පාර හි පදිංචි අලහකෝන් ආරච්චිගේ ප්‍රේමචන්ද්‍ර වන මම ශ්‍රී ලංකා ජනරජයටත් සාමාන්‍ය ජනතාවටත් කරන ලද දැනුම් දීම නම් ප්‍රසිද්ධ නොතාරිස් සුදර්ශි කරුණාරත්න මෙනවිය විසින් ලියා සහතික කරන ලද අංක 111 සහ 2006.05.16 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටෝර්නි බලකාර තැන වශයෙන් ලුණුවිල උතුරු කිරිමැටියාන චාර්ල්ස් සිරිවර්ධන මාවත හි පදිංචි කුරුවිට ආරච්චිලාගේ චාන්දනී ප්‍රීති ජයතිලක පත් කරනු ලැබූ අතර මෙතැන් පටන් එම පත් කිරීම අවලංගු කරන බව මෙසේ දැනුම් දෙමි.

04-617

---

**නිවේදනයයි**

මෙම සමාගම 2014.03.03 වැනි දින සංස්ථාපිත කළ බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ලක්දිව ඩිපාර්ට්මන්ටල් ස්ටෝර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 97322
සමාගම ලියාපදිංචි කළ දිනය : 2014.03.03
ලියාපදිංචි කාර්යාලය : අංක 79, මාතලේ පාර, කුඩුගල, අඹතැන්න, මහනුවර
ලේකම් : නීතිඥ ජේ. එම්. අස්රප්, අංක 259, මාතලේ පාර, අකුරණ.

04-646

---

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : චිබී'ස් ෆ්‍රෙන්ඩ් (ගරන්ටි) ලිමිටඩ්
සමාගමේ අංකය : ජීඑල් 2239
ලියාපදිංචි කාර්යාලය : අංක 247, පොල්හේන්ගොඩ පාර, කොළඹ 05
සංස්ථාපිත දිනය : 2013.03.06

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-645

---

**ඇටෝර්නි බලය අවලංගු කිරීම පිළිබඳ දැන්වීමයි**

නිව්යෝර්ක් 11364, ඔක්ලන්ඩ්, උද්‍යානයේ 224 වීදියේ 67-01 හි දැනට පදිංචි මහරගම, නාවින්න, පරණ පාර, අංක 117 චන්ද්‍රානි ඒකනායක ජයකොඩි වන මා විසින් ඊ. ඩී. පලිහපිටිය මහතා විසින් වර්ෂ 2008.07.13 වැනි දින ලියා සහතික කරන ලද අංක 1209 යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය 2014.04.15 වැනි දින සිට අවලංගු හා බල රහිත ශූන්‍ය ලේඛනයක් බව මෙයින් සියලු දෙනාගේ ම දැන ගැනීම පිණිස දන්වන අතර එකී බලපත්‍රය යටතේ මාගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු වශයෙන් මැටිකුඹුර, වෑවල, සිසිල් සෙවන දරන ස්ථානයේ පදිංචි අනුරුද්ධ කරුණාරත්න ඒකනායක යන අයට මා වෙනුවෙන් ක්‍රියා කිරීමට ලබා දී ඇත්තාවූ බලය වර්ෂ 2014.04.15 වැනි දින සිට අහෝසි වන බව සියලු දෙනාම මෙයින් දැන ගත යුතු වේ.

චන්ද්‍රානි ඒකනායක ජයකොඩි.

2014 අප්‍රේල් මස 03 වැනි දින.

04-662

---

**ඇටෝර්නි බලය අවලංගු කිරීම**

කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ, 380/56 දරන ස්ථානයේ පදිංචි සුදත් පරාක්‍රම තල්පහේවා (ජා. හැ. අංක 651021286 V) වන මා විසින් කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ, 380/56 දරන ස්ථානයේ පදිංචි සුගතදාස තල්පහේවා (ජා. හැ. අංක 273460136 V) යන අය වෙත ප්‍රදානය කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් සී. ආර්. රාජේස්වරන් විසින් ලියා සහතික කරන ලද අංක 336 සහ 1994.07.01 දිනැති ඇටෝර්නි බලපත්‍රය මෙහි දින සිට අවලංගු කර අහෝසි වන අතර, එය බල පැවැත්වීමක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

සුදත් පරාක්‍රම තල්පහේවා.

2014 මාර්තු මස 26 වැනි දින.

04-626

---

**සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය**

(සමාගම් පනතේ 9 (1) වගන්තියට අනුගාමීවයි)

සමාගමේ නම : සුරේෂ් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 97924
ලියාපදිංචි ලිපිනය : ෆුලර්ටන් කර්මාන්ත කලාපය, නාගොඩ, කළුතර.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
එච් ටී පී බිස්නස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

තෙවැනි මහල, වෙස්ට් වින්ග්,
මෙතඩිස්ට් සෙන්ට්‍රල් ගොඩනැගිල්ල,
අංක 2/5, දුම්රියපල පාර,
කොළඹ 03.

04-686

---

**දැන්වීමයි**
**පී වී අයි සී මැනේජ්මන්ට් කම්පැණි ලිමිටඩ් සමාගමේ යෝජිත ප්‍රකාශිත ප්‍රාග්ධන අවකරණය**

2007 අංක 07 දරන සමාගම් පනතේ 59 වගන්තිය ප්‍රකාරව, පී වී අයි සී මැනේජ්මන්ට් කම්පැණි ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින්, එකී සමාගමේ සම්පූර්ණයෙන් ගෙවූ සාමාන්‍ය කොටස් 6,290,450 මගින් නියෝජනය වන රුපියල් 250,004,500ක් වටිනා ප්‍රකාශිත ප්‍රාග්ධනය, සම්පූර්ණයෙන් ගෙවූ සාමාන්‍ය කොටස් 6,290,450 මගින් නියෝජනය වන රුපියල් 5,000,000 දක්වා අවකරණය කිරීම පිණිස තම කොටස් හිමියන් වෙත නිර්දේශ කිරීමට සහා සම්මත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඉහත සඳහන් ප්‍රාග්ධන අවකරණය ක්‍රියාත්මක කරනුයේ, සමාගමේ නිකුත් කළ හා සම්පූර්ණයෙන් ගෙවූ සාමාන්‍යය කොටස් ප්‍රමාණයේ කිසිදු වෙනසක් සිදු නොවන අයුරින්, සමාගමේ පවතින අධි ප්‍රාග්ධනිත තත්ත්වය අවම කිරීමටය. ඒ අනුව එහි ප්‍රතිඵලයක් ලෙස සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් 5,000,000 දක්වා අඩුවනු ඇත.

ඒ අනුව මෙම යෝජිත ප්‍රකාශිත ප්‍රාග්ධන අවකරණය සඳහා විශේෂ යෝජනා සම්මතයක් මගින් කොටස් හිමියන්ගේ අනුමැතිය ලබාගනු පිණිස 2014 මැයි 30 වැනි දින සඳහා අති විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමට අදහස් කොට ඇත.

කේ. එච්. එල්. කෝපරේට් සර්විසස් ලිමිටඩ්,
ලේකම්වරු.

පී. වී අයි. සී මැනේජ්මන්ට් කම්පැණි ලිමිටඩ්.

04-687

### දැන්වීමයි

පහත සඳහන් සමාගම 2014 මාර්තු මස 03 වැනි දින සංස්ථාපනය කර ඇති බව 2007 අංක 07 දරන සමාගම් පනත අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ

සමාගමේ නම : ලයිට් ට්‍රැවලර් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 97313
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 42/එෆ්, ගැමුණු පාර, කොතලාවල, කඩුවෙල.

04-688

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

අංක 161, ඒ. පරණ ගංතොට පාර, මාවිල්මඩ, මහනුවර මධ්‍යම පළාත (නව ලිපිනය අංක 08, ශ්‍රී පාද මාවත, රත්නපුර සබරගමු පළාත) හි පදිංචි අසේල රුක්මල් අංගම්මන වන මම, 23 1/4, දේව වීදිය, මහනුවර පදිංචි ප්‍රසිද්ධ නීතිඥ එම්. යූ. එස්. විතානගේ මහතා විසින් වර්ෂ 2008ක් වූ ජූනි මස හත් වන (07) වැනි දින ලියා සහතික කළ අංක 789 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් අංක 161 ඒ, පරණ ගංතොට පාර, මාවිල්මඩ, මහනුවර මධ්‍යම පළාත (නව ලිපිනය "කුමරිවිලා", මුහුදුකටුව, මාරවිල, පුත්තලම) හි පදිංචි නිල්මිණි ඉරේෂා රුද්‍රිගු යන අය වෙත පවරන ලද එකී ඇටෝර්නි බලය වර්ෂ 2014ක් වූ අප්‍රේල් මස 09 වැනි දින පටන් මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ට කළ බව ශ්‍රී ලංකාවාසී සියලු දෙනාටම මෙයින් දැනුම් දෙමි.

එබැවින් මින් පසු අංක 789 දරන එකී ඇටෝර්නි බලපත්‍රය භාවිතා කරමින් මාගේ එකී ඇටෝර්නි බලකාරිය විසින් සිදු කරනු ලබන කිසිදු නෛතික හෝ වෙනත් ඕනෑම කටයුත්තක් සම්බන්ධයෙන් මාගේ කිසිදු වගකීමක් හෝ බැඳීමක් නොමැත.

අසේල රුක්මල් අංගම්මන.

04-689

---

### ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාර නිවේදනය

සමාගමේ කලින් නම : ජානක හෝල්ඩින් (ප්‍රයිවට්) ලිමිටඩ්
පී. වී. 73021
අංක 162/11/ඒ, කඩුවෙල පාර, මාලඹේ.
සමාගමේ අලුත් නම : සිම්ලක්ස් ප්ලාස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

04-741

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දන්වමු.

සමාගමේ නාමය : ෆුල් සර්කල් කෝපරේට් මාකටිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 97778
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 485/1 සී, දෙමටගොඩ පාර, කොළඹ 09
සංස්ථා ගත කළ දිනය : 2014.03.26

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-774

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කරන්නට යෙදුන බැව් මෙයින් දන්වා සිටිමි

නම : ගාර්ට්මෝ ටී ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 97970
සංස්ථාගත කළ දිනය : 2014 අප්‍රේල් මස 03 වැනි දින
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : 175/34 බී, සේනානායක මාවත, නාවල.

අධ්‍යක්ෂක.

04-782

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත

***ලියොස්ටෙ ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් - පී වී 97841***

ඉහත සඳහන් සමාගම 2014.03.27 වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 207/03/බී, අතුරුගිරිය පාර, මාලපල්ල, පන්නිපිටිය යන ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමු.

ලීගල් ඇන්ඩ් කෝපරේට් කන්සල්ටන්ට්ස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 156/1/8, අලුත්කඩේ වීදිය,
කොළඹ 12.

04-754

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමි

සමාගමේ නම : රිවයිවල් හෙල්ත්කෙයා සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 66220
ලියාපදිංචි කළ දිනය : 2008.11.17
ලියාපදිංචි කළ ලිපිනය : අංක 38, නෙල්සන් පෙදෙස, කොළඹ 06.

අධ්‍යක්ෂ.

04-750

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

(23) ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) අප්පු ආචාරිගේ දොන් නන්දන සුනීත පුෂ්පකුමාර දුනුවිල ආර්ඩබ්පී ආර්එස්පී.

*එ. 2014 ජනවාරි මස 1 වැනි දින සිට :*
(1) ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) ජගත් දැඩිමුණි
(2) ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) දිසානායක මුදියන්සේලාගේ කපිල දීපාලි බණ්ඩාර සුස්සැල්ල ආර්ඩබ්පී ආර්එස්පී
(3) ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) හේරත් මුදියන්සේලාගේ වසන්ත කුමාර හේරත් ආර්ඩබ්පී ආර්එස්පී
(4) ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) දොඩන්ගොඩ ලියනගේ සරත්චන්ද්‍ර
(5) ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) වැලිසරගේ ගුණවර්ධන ඩයස්
(6) ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) මුතුකුඩ විජේසූරිය ආරච්චගේ අජිත් විජේසූරිය ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී.
(7) ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) ගම්මුනේගේ දොන් සූරියබණ්ඩාර
(8) ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) මුහන්දිරම් රාල්ලාගේ කමල් වික්‍රම බණ්ඩාර පින්නවල ආර්ඩබ්පී ආර්එස්පී.
(9) ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) තිරමුණි මහේෂ් අබේරත්න එල්එස්සී
(10) ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) වීරගල මුදියන්සේලාගේ චන්ද්‍රසිරි බණ්ඩාර
(11) ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) නායකරත්න මුදියන්සේලාගේ විජය ශ්‍රී බණ්ඩාර නායකරත්න ආර්එස්පී.

*ඒ. 2014 පෙබරවාරි මස 19 වැනි දින සිට :*
(1) ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) ගොඩපුස්සේ මුදියන්සේලාගේ චිත්‍රලාල් කිත්සිරි බණ්ඩාර ඒකනායක ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී.
(2) ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) සන්දරාදුර ධර්මසිරි චන්ද්‍රසිරි ද සිල්වා ආර්ඩබ්පී ආර්එස්පී.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 21 වැනි දින,
කොළඹ දී ය.
04-677

2014 අංක 262
MOD/DEF/2/01/ARF/REM/556

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීමක්

**විශ්‍රාම ගැන්වීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 නොවැම්බර් මස 03 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

දෙවන ලුතිතන් දිසානායක මුදියන්සේලාගේ රූපානන්ද ධනපාල ආර්එස්පී ශ්‍රිලපාහ (නි/67457)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.
04-676

---

2014 අංක 263

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2014 අප්‍රේල් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් චම්පික ඉන්ද්‍රජිත් ජයමුණි, ගැහේබ (නි/4466)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.
04-681

---

2014 අංක 264
MOD/DEF/07/01/AVF/RET/527

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2014 අප්‍රේල් මස 19 වැනි දින සිට මේජර් නිලයේ නිල ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ගාර්දිය කතළුවෙ හේවාගේ අනිල් ප්‍රනාන්දු, ශ්‍රීලයුයුබ (නි/3421)

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2014 අප්‍රේල් මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ගාර්දිය කතළුවෙ හේවාගේ අනිල් ප්‍රනාන්දු, ශ්‍රීලයුයුබ (නි/3421)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.
04-682

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2014 අංක 265

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ කේ. ඩී. එන්. රංජිත් අශෝක මහතා 2013 දෙසැම්බර් මස 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

04-614/1

2014 අංක 266

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ එච්. ජී. සුමනසිංහ මහතා 2013 ජූලි මස 09 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන) වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

04-614/2

## අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය

2014 අංක 267

**ස්ථාන මාරු පත්වීම්**

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ප්‍රසාදය පරිදි පහත සඳහන් අධිකරණ නිලධාරීන් ස්ථාන මාරු පත්වීම් කරනු ලැබේ.

| *අංකය* | *නිලධාරියාගේ නම ක්‍රියාත්මක වන දිනය* | *ස්ථාන මාරු පත්වීම* | *අධිකරණය/පත්වීම* |
|---|---|---|---|
| 01. | ටී. එම්. සී. එස්. ගුණසේකර මහතා | 2014.01.01 | ඇඹිලිපිටිය දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 02. | ආර්. ආර්. ජේ. යූ. ටී. රාජකරුණා මහතා | 2014.01.01 | ගම්පොල දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 03. | යූ. ආර්. වී. බී. රණතුංග මහතා | 2014.01.01 | මාතලේ දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 04. | එච්. එස්. සෝමරත්න මහතා | 2014.01.01 | පූගොඩ දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 05. | ඒ. එන්. ජේ. ද අල්විස් මහත්මිය | 2014.01.01 | මාලිගාකන්ද මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 06. | ඩබ්ලිව්. වයි. එස්. ප්‍රනාන්දු මෙනෙවිය | 2014.01.01 | කොළඹ අතිරේක දිසා විනිශ්චයකාර, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 07. | එස්.නන්දසේකරන් මහත්මිය | 2014.01.01 | චාවකච්චේරි දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 08. | එම්. ජී. එන්. සී. එම්. ෆර්ඩිනැන්ඩස් මහත්මිය | 2014.01.01 | නුවරඑළිය දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 09. | එල්. ආර්. බණ්ඩාර මහතා | 2014.01.01 | කොළඹ අතිරික්ත අතිරේක දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරික්ත අතිරේක මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 10. | ආර්. ඒ. ඩී. ජී. සී. රණවක මහතා | 2014.01.01 | ගල්කිස්ස දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 11. | ජේ. ඒ. කහඳගමගේ මහතා | 2014.01.01 | හොරණ මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත්, ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර, අතිරේක දිසා විනිශ්චයකාර සහ අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර |
| 12. | ඒ. ජී. අලුත්ගේ මහතා | 2014.01.01 | නුගේගොඩ මහේස්ත්‍රාත්, ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර, අතිරේක දිසා විනිශ්චයකාර සහ අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර |
| 13. | ආර්. එස්. එස්. සපුවිද මහතා | 2014.01.01 | මහනුවර අතිරේක දිසා විනිශ්චයකාර, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 14. | එම්. කේ. ඒ. පීරිස් මහතා | 2014.01.01 | ගම්පහ අතිරේක දිසා විනිශ්චයකාර, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |

| අංකය | නිලධාරියාගේ නම ක්‍රියාත්මක වන දිනය | ස්ථාන මාරු පත්වීම | අධිකරණය/පත්වීම |
| --- | --- | --- | --- |
| 15. | එම්. කේ. එම්. අබේරත්න මහත්මිය | 2014.01.01 | කොළඹ අතිරේක දිසා විනිශ්චයකාර, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 16. | ඩී. එෆ්. එච්. ගුණවර්ධන මහතා | 2014.01.01 | අවිස්සාවේල්ල, දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 17. | එම්. ඒ. ඒ. එම්. මාසිංහ මහතා | 2014.01.01 | කළුතර මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත්, ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර, අතිරේක දිසා විනිශ්චයකාර සහ අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර |
| 18. | කේ. පී. ප්‍රනාන්දු මහතා | 2014.01.01 | කොළඹ අතිරේක දිසා විනිශ්චයකාර, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 19. | එම්. පිනිදිය මහතා | 2014.01.01 | ගාල්ල දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 20. | එස්. ලෙනින්කුමාර් මහතා | 2014.01.01 | කයිට්ස් දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 21. | ආර්. එස්. එම්. මහේන්ද්‍රරාජා මහතා | 2014.01.01 | කැබිතිගොල්ලෑව දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 22. | එම්. ජී. කේ. පෙරේරා මහතා | 2014.01.01 | ත්‍රිකුණාමලය අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත්, අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර, අතිරේක දිසා විනිශ්චයකාර සහ අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර |
| 23. | ඩබ්ලිව්. ආර්. එම්. ඒ. වික්‍රමසිංහ මහතා | 2014.01.01 | ගාල්ල අතිරේක දිසා විනිශ්චයකාර, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 24. | එල්. එම්. රත්නායක මහතා | 2014.01.01 | මතුගම අතිරේක දිසා විනිශ්චයකාර, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 25. | ආර්. ඒ. එම්. රාජපක්ෂ මහතා | 2014.01.01 | රත්නපුර අතිරේක දිසා විනිශ්චයකාර, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 26. | ආර්. එම්. ඒ. පෙරේරා මහත්මිය | 2014.01.01 | කොළඹ අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර, අතිරේක දිසා විනිශ්චයකාර සහ අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර |
| 27. | එම්. එච්. ෆරික්ඩීන් මහතා | 2014.01.01 | වලපනේ දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 28. | සී. එස්. එදිරිමාන්න මහතා | 2014.01.01 | බද්දේගම දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 29. | ටී. සරවනරාජා මහතා | 2014.01.01 | ත්‍රිකුණාමලය මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත්, ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර, අතිරේක දිසා විනිශ්චයකාර සහ අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර |
| 30. | එස්. සතිස්තරන් මහතා | 2014.01.01 | මල්ලාකම් දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 31. | ජේ. කජනිතිබාලන් මහතා | 2014.01.01 | පේදුරුතුඩුව දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 32. | යූ. එල්. එම්. අස්හාර් මහතා | 2014.01.01 | අක්කරපත්තුව මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත්, ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර, අතිරේක දිසා විනිශ්චයකාර සහ අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර |
| 33. | පී. එම්. ටී. බණ්ඩාර මහතා | 2014.01.01 | මීගමුව අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත්, අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර, අතිරේක දිසා විනිශ්චයකාර සහ අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර |
| 34. | එල්. ඩී. එච්. ද සිල්වා මහතා | 2014.01.01 | පොළොන්නරුව දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 35. | එස්. එම්. ඒ. එස්. මංචනායක මහතා | 2014.01.01 | හලාවත දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 36. | එම්. පී. රණසිංහ මහතා | 2014.01.01 | මහර අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 37. | බී. ඒ. ආර්. සෝමසිංහ මහතා | 2014.01.01 | බලපිටිය දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 38. | ටී. ඩී. ගුණසේකර මහතා | 2014.01.01 | කළුතර දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 39. | එස්. අයි. කාලිංගවංශ මෙනවිය | 2014.01.01 | පූගොඩ අතිරේක දිසා විනිශ්චයකාර, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 40. | ටී. ජී. එස්. ඒ. පෙරේරා මහතා | 2014.01.01 | කොළඹ අතිරේක දිසා විනිශ්චයකාර, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 41. | බී. ජේ. එන්. ටී. කේ. බෝගහදෙනිය මහත්මිය | 2014.01.01 | බිබිල මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 42. | පී. එස්. පතිරණ මෙනෙවිය | 2014.01.01 | මොරවක දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 43. | පී. එම්. අමරසේන මහතා | 2014.01.01 | තංගල්ල දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 44. | ජී. එන්. ප්‍රියදර්ශනී මෙනෙවිය | 2014.01.01 | අඟුණකොලපැලැස්ස මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 45. | යූ. ජී. ඩබ්ලිව් කේ. ඩබ්ලිව්. ජිනදාස මහතා | 2014.01.01 | කඩුවෙල දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 46. | ටී. ඒ. ඩී. හේමපාල මහතා | 2014.01.01 | කඩුවෙල අතිරේක දිසා විනිශ්චයකාර, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 47. | එච්. කේ. එන්. පී. අල්විස් මහතා | 2014.01.01 | කෑගල්ල මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත්, ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර, අතිරේක දිසා විනිශ්චයකාර සහ අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර |
| 48. | එම්. ඩබ්ලිව්. ජේ. කේ. වීරමන් මහතා | 2014.01.01 | රත්නපුර දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 49. | ඩබ්ලිව්. කේ. ඩී. එස්. වීරතුංග මහත්මිය | 2014.01.01 | හෙට්ටිපොල මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 50. | බී. අබේසිංහ මහත්මිය | 2014.01.01 | කැකිරාව දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චියකාර |
| 51. | ජී. එම්. ටී. යූ. සුවන්දුරුගොඩ මහතා | 2014.01.01 | දෙයියන්දර මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත් සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 52. | කේ. යූ. ටී. ද සිල්වා මෙනවිය | 2014.01.01 | අනුරාධපුර අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත්, අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර, අතිරේක දිසා විනිශ්චයකාර, සහ අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර |
| 53. | ජී. එස්. පී. හේමචන්ද්‍ර මහතා | 2014.01.01 | බණ්ඩාරවෙල දිසා විනිශ්චයකාර, පවුල් අධිකරණ විනිශ්චයකාර, අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක ළමා මහේස්ත්‍රාත් සහ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර |
| 54. | ජේ. ට්‍රොට්ස්කි මහතා | 2014.01.01 | බණ්ඩාරවෙල මහේස්ත්‍රාත්, ළමා මහේස්ත්‍රාත්, ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර, අතිරේක දිසා විනිශ්චයකාර සහ අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර |
| 55. | කේ. ඒ. ජී. පුංචිහේවා මහත්මිය | 2014.01.01 | කොළඹ අතිරික්ත අතිරේක මහේස්ත්‍රාත්, අතිරික්ත අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාර, අතිරික්ත අතිරේක දිසා විනිශ්චයකාර සහ අතිරික්ත අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාර. |

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,
සිසිර රත්නායක,
*වැඩබලන ලේකම්,*
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2014 මාර්තු මස 31 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.
04-595

---

2014 අංක 268

**නව පත්කිරීම්**

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ප්‍රසාදය පරිදි පහත සඳහන් අධිකරණ නිලධාරීන්ගේ නව පත් කිරීම් සිදු කරනු ලැබේ.

| අංකය | නිලධාරියාගේ නම | නව පත්කිරීම සිදු කරනු ලබන දිනය | අධිකරණය/පත්වීම |
| --- | --- | --- | --- |
| 01. | එන්. ටී. හීනටිගල මහතා | 2014.02.17 | ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පංතියේ I ශ්‍රේණියේ අධිකරණ නිලධාරි - කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අතිරික්ත අතිරේක මහේස්ත්‍රාත් (පුහුණු) |
| 02. | ආර්. එම්. එස්. එන්. සමරතුංග මහතා | 2014.02.17 | ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පංතියේ I ශ්‍රේණියේ අධිකරණ නිලධාරි - කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අතිරික්ත අතිරේක මහේස්ත්‍රාත් (පුහුණු) |
| 03. | ඒ. අයි. හෙට්ටිවත්ත මෙනවිය | 2014.02.17 | ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පංතියේ I ශ්‍රේණියේ අධිකරණ |

| අංකය | නිලධාරියාගේ නම | නව පත්කිරීම සිදු කරනු ලබන දිනය | අධිකරණය/පත්වීම |
|---|---|---|---|
| | | | නිලධාරි - කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අතිරික්ත අතිරේක මහේස්ත්‍රාත් (පුහුණු) |
| 04. | එම්. එස්. එන්. සම්සුදීන් මහතා | 2014.02.17 | ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පංතියේ I ශ්‍රේණියේ අධිකරණ නිලධාරි - කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අතිරික්ත අතිරේක මහේස්ත්‍රාත් (පුහුණු) |
| 05. | ඩී. සී. කේ. පෙරේරා මහතා | 2014.02.17 | ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පංතියේ I ශ්‍රේණියේ අධිකරණ නිලධාරි - කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අතිරික්ත අතිරේක මහේස්ත්‍රාත් (පුහුණු) |
| 06. | ආර්. වී. එන්. කේ. විතාරණ මෙනවිය | 2014.02.17 | ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පංතියේ I ශ්‍රේණියේ අධිකරණ නිලධාරි - කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අතිරික්ත අතිරේක මහේස්ත්‍රාත් (පුහුණු) |
| 07. | පි. ඩබ්. එන්. ඩී. පියරත්න මහත්මිය | 2014.02.17 | ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පංතියේ I ශ්‍රේණියේ අධිකරණ නිලධාරි - කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අතිරික්ත අතිරේක මහේස්ත්‍රාත් (පුහුණු) |
| 08. | එල්. ඒ. ඩී. ජේ. එස්. විජේතුංග මහත්මිය | 2014.02.17 | ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පංතියේ I ශ්‍රේණියේ අධිකරණ නිලධාරි - කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අතිරික්ත අතිරේක මහේස්ත්‍රාත් (පුහුණු) |
| 09. | කේ. ආර්. එන්. එස්. වීරසිංහ මහතා | 2014.02.17 | ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පංතියේ I ශ්‍රේණියේ අධිකරණ නිලධාරි - කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අතිරික්ත අතිරේක මහේස්ත්‍රාත් (පුහුණු) |
| 10. | අයි. එම්. එස්. බී. ඉලංගසිංහ මහතා | 2014.02.17 | ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පංතියේ I ශ්‍රේණියේ අධිකරණ නිලධාරි - කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අතිරික්ත අතිරේක මහේස්ත්‍රාත් (පුහුණු) |
| 11. | ටී. එන්. එල්. මහවත්ත මහත්මිය | 2014.02.17 | ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පංතියේ I ශ්‍රේණියේ නිලධාරි - කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අතිරික්ත අතිරේක මහේස්ත්‍රාත් (පුහුණු) |

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,
සිසිර රත්නායක,
මහාධිකරණ විනිශ්චයකාර,
වැඩ බලන ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2014 මාර්තු මස 31 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.
04-594

---

2014 අංක 269

**නව පත්කිරීම්**

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ප්‍රසාදය පරිදි පහත සඳහන් කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන්ගේ නව පත් කිරීම් සිදු කරනු ලැබේ.

| අංකය | නිලධාරියාගේ නම | නව පත්කිරීම සිදු කරනු ලබන දිනය | අධිකරණය/පත්වීම |
|---|---|---|---|
| 01. | එම්. එන්. නානයක්කාර මහත්මිය | 2014.02.17 | ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II ශ්‍රේණියේ කම්කරු විනිශ්චයාධිකාර සභාපති |
| 02. | ටී. තේනබදු මහත්මිය | 2014.02.17 | ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II ශ්‍රේණියේ කම්කරු විනිශ්චයාධිකාර සභාපති |

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,
සිසිර රත්නායක,
මහාධිකරණ විනිශ්චයකාර,
වැඩ බලන ලේකම්,

අධිකරණ සේවා කොමිෂන් සභාව.
2014 මාර්තු මස 31 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.
04-593

---

# රජයේ නිවේදන

**1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත**

අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත 1959 අංක 5 දරන ආඥාපනත 1964 අංක 24 දරන පනත 1973 අංක 41 දරන පනත 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1) 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ටී. එම්. එස්. එන්. කේ. විජේතුංග,
ලේකම් (වැ.බ.),
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2014 අප්‍රේල්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව,
අංක 80,
අධිකරණ මාවත,
කොළඹ 12.

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| 01 42494 | රණසිංහ කංකානමලාගේ අයිරාංගනී රණසිංහ මිය, අංක 82, කිඹුල්ගොඩ, යක්කල. | සම්පත් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් කම්පැනි ලිමිටඩ්, අංක 60, නුවර පාර, කිරිබත්ගොඩ. |
| 02 42596 | රාජපක්ෂ මුදලිගේ මනෝජා සංජීවනී මිය, අංක : 322/1/7, පාසල් මාවත, කොතලාවල, කඩුවෙල | ගවඅධිකාරි මුදියන්සේලා උන්ඩියේ ගෙදර ඉන්දික සුදත් බණ්ඩාර සෙනෙවිරත්න මයා, අංක 66/ඒ, දඹුල්ල පාර, නාවුල. |
| 03. 42811 | 1. මොරවක් කෝරලාගේ මේරියන් සුවේන්ද්‍රානි ෆොන්සේකා මිය, අංක 225/2, මීගමු පාර, වත්තල.<br>2. මොරවක් කෝරලාගේ ඩොමිනික් සුදත් ෆොන්සේකා මයා, අංක 225/2, මීගමු පාර, වත්තල. | තෙවරාතන්ත්‍රිගේ ඈන් ගයනා නිමාලි ප්‍රනාන්දු මිය, අංක 40, රජමල්වත්ත පාර, කොළඹ 15. |
| 04. 42939 | ගවුස් මොහිදීන් සාහුල් හමීඩ් මයා, අංක 51/1, ජලාශය පාර, රත්නපුර. | සංගප්පුලි ආරච්චිල්ලාගේ දුෂ්ෂන්තා කුමාරි සෙනරත් මිය, හංසි ක්ලෙක්ෂන්, රක්වාන පාර, පැල්මඩුල්ල. |
| 05. 42999 | මුතුකුඩ ආරච්චිගේ දෝන අයිරාංගනී මිය, අංක 10, නන්දන, මූකලංගමුව, සීදුව. | සමරසිංහ ආරච්චිගේ රංජනී සමරසිංහ මිය, අංක. 171/5, දුම්රියපොල පාර පිටුපස, සීදුව. |
| 06 43053 | හෙට්ටිආරච්චිල්ලාගේ නොහොත් හෙට්ටි අච්චිල්ලාගේ සීලවතී මිය, ශ්‍රමදාන මාවත, තුඹලියද්ද, වරකාපොල. | ගොඩයලාගේ පේමසිරි හෙවත් ප්‍රේමසිරි මයා අංක. බී. 92/2, මායින්නොලුව, වරකාපොල. |
| 07. 43059 | පොන්වීර ආරච්චිලාගේ ගාමිණී සුදත් මයා, වැදිකන්ද, අලව්ව. | ඉඩම්පිටිය මුදලිගේ දොන් ලසන්ත කුමාර මයා, අංක 3/129, සරණ හිමි මාවත, බොරැල්ල. |

04-678

---

**1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත**

අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත 1959 අංක 5 දරන ආඥාපනත 1964 අංක 24 දරන පනත 1973 අංක 41 දරන 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකය ඉදිරියේ දක්වා ඇති ණයකරු ණයහිමි යන දෙපක්ෂය ඉල්ලා අස්කර ගැනීමට කරන ලද ඉල්ලීමට ඉඩදෙමින් නිෂ්ප්‍රභා කිරීම නිසා 2013 මැයි මස 03 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද පහත සඳහන් දැන්වීම අවලංගු කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| ඉල්ලුම්පත් අංකය | | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|---|
| (06) 42593 | 1. | දේවනාරායන හිත්තර ගෙදර සුනිල් තිස්ස මයා කොට්ටල්බද්ද, අරණායක. | සූරිගේ නැන්සි නෝනා මිය, සූරිය නිවස, මැවිලිපිටිය, අරණායක. |
| | 2. | උඩගෙදර රාළලාගේ කුමුදුනී උඩගෙදර මිය, කොට්ටල්බද්ද, අරණායක. | |

ටී. එම්. එස්. එන්. කේ. විජේතුංග,
ලේකම් (වැ.බ.),
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2014 අප්‍රේල් මස වැනි දින,
අංක 80, අධිකරණ මාවත,
කොළඹ 12.
04-679

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/33/2013/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2014.04.25 වැනි දින සිට 2014.05.09 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2014.05.16 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

උපලේඛනය

| ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර | ඉඩම්වල විස්තර | ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ දරන කොට්ඨාසයේ 1077 වෙළුමේ 46 පත් ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කොටහේන නැගෙනහිර වාසල පාර පිහිටි වරිපනම් අංක 118 වාසල පාර දරන ලොට් ඒ කැබැල්ලට මායිම්, | 01. වී. තෙවසේනාධිපති ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2006.03.04 වැනි දින ලියා සහතික කරන ලද අංක 4867 දරන ප්‍රකාශන ඔප්පුව. |
| | උතුර : වරිපනම් අංක 115, වොල් ස්ට්‍රීට් නැගෙනහිර : ලොට් බී ඉඩම, වරිපනම් අංක 111, වෝල් ස්ට්‍රීට් දකුණ : වරිපනම් අංක 109 වොල් ස්ට්‍රීට් බස්නාහිර : වාසල පාර ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 2.90 | 02. වී. තෙවසේනාධිපති ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2006.03.04 දින ලියා සහතික කරන ලද අංක 4868 දරන තෑගි ඔප්පුව. |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක : 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
04-624

## ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා යටතේ පළ වන ගැසට් අංක 04-755 දරන දැන්වීම් සඳහා කරුණාකර 2014.04.25 වැනි දින රජයේ ගැසට් පත්‍රය බලන්න

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

එම්. වී. ආර්. පී. ආර්. පෙරේරා සහ ජේ. ඒ. එච්. ජයසිංහ.

ගිණුම් අංක : 0060 5000 3009.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ක් වූ පෙබරවාරි මස 28 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එන්. කේ. කරුණාතිලක යන අය විසින් ලියා සහතික කරන ලද 2012 අගෝස්තු මස 09 දාතම හා අංක 286 සහ 288 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුල්ලේගම විතානගේ රසික ප්‍රියදර්ශන රණවීර පෙරේරා සහ ජයසිංහ ආරච්චිගේ හිමාලි ජයසිංහ යන අය බන්ධනදායින් වශයෙන් හා එකී මුල්ලේගම විතානගේ රසික ප්‍රියදර්ශන රණවීර පෙරේරා යන අය උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 286 සහ 288 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් පනස්තුන් ලක්ෂ අසූ දෙදහස් හයසිය හතලිස් පහයි ශත දෙකක (රු. 53,82,645.02) මුදලක් 2014 පෙබරවාරි මස 09 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් පනස්තුන් ලක්ෂ අසූ දෙදහස් හයසිය හතලිස් පහයි ශත දෙකක (රු. 53,82,645.02) මුදල ද 2014 පෙබරවාරි මස 10 දින සිට අංක 286 සහ 288 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් ලක්ෂයක (රු. 7,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහනමයක් (19%) හා තවත් රුපියල් තිස්හත් ලක්ෂ හැත්තෑ දෙදහස් තිස් හතයි ශත තුනක (රු. 37,72,037.03) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 286 සහ 288 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කිරිල්ලවල පිහිටි "මිල්ලගහවත්ත හි ලොට් E" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ජී. ගුණතිලක යන අය විසින් සාදන ලද 2012 අප්‍රේල් මස 06 දාතම හා අංක 7852 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : මිහිඳු මාවත, ගිණිකොණට : අංක 24/2009 දරන පිඹුරේ ලොට් E, නිරිතට : අංක 24/2009 දරන පිඹුරේ ලොට් B සහ වයඹට : අංක 6/1992 දරන පිඹුරේ ලොට් 5 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ නමයයි දශම පහයි හයක් (අ. 0, රූ. 0, පර්. 19.56) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධන් ද සමග එකී අංක 7852 දරන පිඹුරට අනුවය.

බලයලත් මානක තැන ආර්. හෙට්ටිආරච්චි යන අය විසින් සාදන ලද 2009 අප්‍රේල් 19 දාතම හා අංක 24/2009 දරන පිඹුරේ නිරූපිත ලොට් A තවත් අයුරකින් මෙහි පහත උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති බලයලත් මානක තැන ආර්. හෙට්ටිආරච්චි යන අය විසින් සාදන ලද 1992 පෙබරවාරි මස 14 දාතම හා අංක 6/1992 දරන පිඹුරේ නිරූපිත ලොට් 6හි නැවත මිනුමක් හා උප බෙදුමක් වේ.

එකී කිරිල්ලවල පිහිටි "මිල්ලගහවත්ත හි ලොට් E'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. හෙට්ටිආරච්චි යන අය විසින් සාදන ලද 1992 පෙබරවාරි මස 14 දාතම හා අංක 6/1992 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 6 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : මිහිඳු මාවත, ගිණිකොනට : ලොට් 7, නිරිතට : ඩබ්ලිව්. එස්. ආනන්ද ගුණසේකර යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ පාර සහ වයඹට : ලොට් 5 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් හයයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 2, පර්. 6.25) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 6/1992 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව C846/99 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 24/2009 දරන එකී පිඹුරේ ලොට් E දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

04- 769

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - කුරුඳුවත්ත ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

සැන්වෝ ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2013 අගෝස්තු මස 29 වැනි දින පවත් වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. සී. පී. වෙත්තසිංහ විසින් 2010 දෙසැම්බර් මස 23 වැනි දින සහතික කළ අංක 3113 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ලොලුව විසින් 2011 ජූනි 02 දින සහතික කළ අංක 2899 යන බැඳුම්කරයන් මගින් සැන්වෝ ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හා තුෂාරි කස්තුරිආරච්චි මද්දුමපටබැඳි උකස්කරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබා ගත් ණය මුදල් සඳහා සුරැකුම් වශයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති දේපළ සැන්වෝ ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා ප්‍රදානය කරන ලද ණය මුදල් වෙනුවෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස්කොට ඇති හෙයින් ද,

එසේ හෙයින් ඉහත කී තුෂාරි කස්තුරිආරච්චි මද්දුමපටබැඳි යන අය සැන්වෝ ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂකවරයකු වශයෙන් එම සමාගමේ පාලනය හා කළමණාකරණය දරන බැවින් ඒ අනුව එකී තුෂාරි කස්තුරිආරච්චි මද්දුමබටබැඳි යන අය එකී සැන්වෝ ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අතථ්‍ය අයිතිකරු හා පාලනය දරන තැනැත්තා වන අතර හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් සැන්වෝ ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට සැපයූ මූල්‍ය පහසුකම් වල නියම අර්ථලාභියා වනුයේ එකී තුෂාරි කස්තුරිආරච්චි මද්දුමපටබැඳි යන අය වන හෙයින් ද,

සැන්වෝ ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ තුෂාරි කස්තුරිආරච්චි මද්දුමපටබැඳි යන අය හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත අයවිය යුතු මුදල ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද, 2013 ජූලි 24 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත රුපියල් අසූදෙලක්ෂ දාහතරදහස් හත්සිය හැටහයයි ශත අසූහතරක් (රු. 82,14,766.84) අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 82,14,766.84ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 ජුලි මස 25 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර වාර්ෂික පොළිය ද සමග ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකර අයකර ගැනීම සඳහා අංක 3113 සහ 2899 දරන උකස් බැඳුම්කර යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇති දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩී. කේලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ බත්තරමුල්ල ඒකකයේ දකුණු තලංගම පෙරේරා මාවතේ වරිපනම් අංක 30/60හි පිහිටි මීගහවත්ත සහ නුගගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. සිරිපාල විසින් 1996 ඔක්තෝබර් මස 23 දින සාදන ලද අංක 1570 දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : බලයලත් මිනින්දෝරු එස්. සිරිපාල විසින් සාදන ලද පිඹුරු අංක 1529හි ලොට් 3 ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එස්. සිරිපාල විසින් සාදන ලද පිඹුරු අංක 1529හි ලොට් 13 ද, දකුණට : බලයලත් මිනින්දෝරු එස්. සිරිපාල විසින් සාදන ලද පිඹුරු අංක 1529හි ලොට් 14 සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එස්. සිරිපාල විසින් සාදන ලද පිඹුරු අංක 1529හි ලොට් 9 මායිම් වූ එකී පිඹුරු අංක 1570 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්සයි දශම දෙකයි එක (අ. 0, රූ. 0, පර්. 20.21)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වන මෙය හෝමාගම දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව පී 1025/264 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත බැඳුම්කර අංක 3113 සහ 2899හි සවිස්තරව විස්තර කොට ඇති බිම් කොටස් මතුපිටින් ඇති ප්‍රවේශ අයිතිය සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

04-753/2

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - ජම්පටා ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ශාන්තලිංගම් ශාන්තකුමාර් සහ ශාන්තකුමාර් තවනිතී.

2014 පෙබරවාරි මස 03 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අධිකාරි විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2013 ජුනි මස 26 දින අංක 1881 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ශාන්තලිංගම් ශාන්තකුමාර් සහ ශාන්තකුමාර් තවනිතී යන අය ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අනූහයලක්ෂ හැත්තෑඅටදහස් එකසියදාහතයි ශත හැත්තෑ තුන (රු. 96,78,117.73) ක මුදලක් 2013 ඔක්තෝබර් මස 31 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 96,78,117.73ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 නොවැම්බර් මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 1881 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද, දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හා මහ නගර සභා සීමාව තුළ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලුණුපොකුණ ග්‍රාම නිලධාරි වසමේ අංක 5 දරන ලුණුපොකුණ පිහිටි කොළඹ 13, 17 වන පටුමගේ වරිපනම් අංක 25/1 දරන මහවත්ත හෙවත් තලංගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් 1991 ජුනි 20 දින පිළියෙල කරන ලද අංක 3197 දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් "ඩී1" වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : 17 වන පටුමගේ වරිපනම් අංක 49/16 දරන පරිශ්‍රයෙන් ද, නැගෙනහිරට : 17 වන පටුමගේ වරිපනම් අංක පී 41 දරන පරිශ්‍රයෙන් ද, දකුණට : මෙහි ලොට් "ඩී2" සහ ලොට් "ඩී3" (වෙන් කරන ලද ප්‍රවේශ මාර්ගය) ද, සහ බස්නාහිරට : අංක 1804ඩී දරන පිඹුරේ හි පාර ද මායිම් වූ එකී අංක 3197 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හතයි දශම හතයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 7.70)ක විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ පත්ඉරු ඒ 962/15 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් 2006 මැයි 19 දින නැවත මැන සාදන ලද අංක 233/2006 දරන පිඹුරට අනුව මෙසේ විස්තර වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හා මහ නගර සභා සීමාව තුළ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලුනුපොකුණ ග්‍රාම නිලධාරී වසම් අංක 5 දරන ලුණුපොකුණ පිහිටි කොළඹ 13, 17 වන පටුමගේ වරිපනම් අංක 25/1 දරන මහවත්ත හෙවත් තලංගහවත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන් කොට සාදන ලද අංක 233/2006 දරන පිඹුරේ හි ලොට් "ඩී1ඒ " වශයෙන් දැක්වෙන ඉඩමට මායිම්, වශයෙන් උතුරට : 17 වන පටුමගේ වරිපනම් අංක 49/16 සහ ලොට් එක්ස් ද, නැගෙනහිරට : 17 වන පටුමගේ වරිපනම් අංක 49/16 සහ පොදු ප්‍රවේශයෙන් ද, දකුණට : පොදු ප්‍රවේශය සහ ලොට් ඩී2ඒ ද සහ බස්නාහිරට : ලොට් ඩී2ඒ සහ ලොට් එක්ස්වලින් ද මායිම් වූ එකී අංක 233/2006 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හත (අ. 0, රූ. 0, පර්. 7)ක් විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත සඳහන් අංක 1881 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති මාර්ග අයිතීන් ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

04-753/1

---

### ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2014 පෙබරවාරි මස 28 දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව නමට මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සුජානි හපුතන්ත්‍රි විසින් ලියා සහතික කරන ලද අංක 1118 හා 2010 සැප්තැම්බර් මස 14 දින ද අංක 1415 හා 2011 සැප්තැම්බර් මස 29 දින ද අංක 1426 හා 2011 ඔක්තෝබර් 13 දින ද අංක 1675 හා 2013 ජනවාරි මස 17 දින ද දරන උකස් බැඳුම්කර මත, අයවිය යුතු මුදල් ගෙවීම්, පේරාදෙණිය, ශ්‍රී අමරවංශ මාවත අංක 3/11 දරන ස්ථානයේ පදිංචි ඇතුගල ප්‍රියනාත් කරුණාරත්න සහ මනෝමි චතුරාණි අර්සකුලසූරිය යනුවෙන් ද හැඳින්වෙන මනෝමි චතුරංගි අර්සකුලසූරිය යන දෙදෙනා විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2013 නොවැම්බර් මස 30 වැනි දිනට ඉහත කී අංක 1118, 1415, 1426 හා 1675 දරන උකස් බැඳුම්කර මත, එකී ඇතුගල ප්‍රියනාත් කරුණාරත්න සහ මනෝමි චතුරාණි අර්සකුලසූරිය යනුවෙන් ද හැඳින්වෙන මනෝමි චතුරංගි අර්සකුලසූරිය යන දෙදෙනාගෙන් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් පනස්හය ලක්ෂ පනස් හය දහස් හාරසිය තිස් අටකුත් ශත හැත්තෑහතක (රු. 56,56,438.77) මුදලක් සහ 2013 දෙසැම්බර් මස 01 වැනි දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහහත් ලක්ෂ විසිහය දහස් අටසිය හැත්තෑවකුත් ශත හතරක් (රු. 17,26,870.04) සඳහා වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් ගණන් බලන ලද පොලිය ද, රුපියල් දෙලක්ෂ පනස් දහසක් (රු. 2,50,000) සඳහා වර්ෂයට සියයට විසි දෙක (22%) බැගින් ගණන් බලන ලද පොළිය ද, රුපියල් තිස්තුන් ලක්ෂ හැට අටදහස් එකසිය දහයකුත් ශත විසිතුනක් (රු. 33,68,110.23) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතියකට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට පහකුත් දශම පහක් (5.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන වාර්ෂික අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව තිබෙන හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් පනස්හය ලක්ෂ පනස් හයදහස් හාරසිය තිස් අටකුත් ශත හැත්තෑහතක (රු. 56,56,438.77) මුදල සහ 2013 දෙසැම්බර් මස 01 වැනි දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහහත් ලක්ෂ විසිහය දහස් අටසිය හැත්තෑවකුත් ශත හතරක් (රු. 17,26,870.04) සඳහා වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් ගණන් බලන ලද පොළිය ද. රුපියල් දෙලක්ෂ පනස් දහසක් (රු. 2,50,000) සඳහා වර්ෂයකට සියයට විසි දෙක (22%) බැගින් ගණන් බලන ලද පොළිය ද, රුපියල් තිස්තුන් ලක්ෂ හැට අටදහස් එකසිය දහයකුත් ශත විසිතුනක් (රු. 33,68,110.23) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) වර්ෂයකට සියයට පහකුත් දශම පහක් (5.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි වෙනත් සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී අංක 1118, 1415, 1426 හා 1675 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1118, 1415, 1426 හා 1675 දරන උකස් බැඳුම්කර මගින් ඇතුගල ප්‍රියනාත් කරුණාරත්න සහ මනෝමි චතුරාණි අර්සකුලසූරිය යනුවෙන් ද හැඳින්වෙන මනෝමි චතුරංගි අර්සකුලසූරිය විසින් ඩීඑෆ්එස්සී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඒෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### අංක 1118, 1415, 1426 හා 1675 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපළාත, කඳුකර පහළ කෝරළේ, මෙගොඩකළුගමුව ග්‍රාම නිලධාරී වසමේ, මොගොඩකළුගමුව ග්‍රාමයේ පිහිටි "ඔලිගොඩපිටියේහේන'' නමැති ඉඩමේ (බලයලත් මානක පී. ආර්. ඩබ්ලිව්. එම්. වීරකෝන් මැන සකස් කළ අංක 2205 හා 1985.09.19 දින දරන පිඹුරේ ලොට් අංක 3 සහ බලයලත් මානක ජී. ඩබ්ලිව්. විජේවර්ධන මැන සකස් කළ අංක 5343 හා 1997.04.25 දින දරන පිඹුරේ ලොට් අංක 12 දරන බිම් කොටස් ඒකාබද්ධ කර නැවත මැනීමක් වන) බලයලත් මානක සරත් වෙලගෙදර මැන සකස් කළ අංක 3654 හා 2000 මාර්තු 22 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 36 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : එකී පිඹුරේ ලොට් අංක 35 ද, නැගෙනහිරට : එම පිඹුරේ නිරූපිත ලොට් අංක 30 ලෙස ලකුණු කළ අඩි 20ක් පළල පාර, දකුණට : එම පිඹුරේ ලොට් අංක 38 ද, බස්නාහිරට : එම පිඹුරේ ලොට් අංක 37 ද යන මායිම් ඇතුළත එකී අංක 3654 දරන පිඹුර ප්‍රකාර පර්චස් දොළහක් (අ. 0, රූ. 0, පර්. 12) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම ගම්පොළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C181/283 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙයට ඉහත කී අංක 3654 දරන පිඹුරේ ලොට් අංක 30, 44 සහ 4 යන බිම් කොටස් මතින් මාර්ග අයිතිය ද ඇතුළත් වේ.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.

04-767

---

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2014 ජනවාරි මස 29 දින දී ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

